# වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

## අධ්‍යක්ෂ ජනරාල්ගේ

# කාර්ය සාධන වාර්තාව

# 2014 වර්ෂය







# දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා රබර් වගාව හා කර්මාන්තය මෙහෙයවීම

# මෙහෙවර

රබර් වගාව හා කර්මාන්තයේ ගුණාත්මක හා ප්‍රමාණාත්මක වර්ධනය උදෙසා නෛතික විධිවිධාන ක්‍රියාත්මක කිරීම, රබර් වගාව සඳහා මූල්‍ය සහනාධාර, කෘෂි යෙදවුම් හා ව්‍යාප්ති සේවා සැපයීම සහ රබර් කර්මාන්තයේ සංවර්ධනය.

# අරමුණු

- රබර් වගා බිම් වල ඵලදායිතාවය ඉහළ නැංවීම
- රබර් වගා බිම් ප්‍රමාණය වැඩි කිරීම
- සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වලට රබර් වගාව ව්‍යාප්ත කිරීම මගින් ග්‍රාමීය දරිද්‍රතාවය පහළ දැමීම
- නිමි භාණ්ඩ නිෂ්පාදනය දිරිගැන්වීම තුලින් රැකියා අවස්ථා වැඩිකිරීම හා විදේශ විනිමය ඉපයීම් ඉහළ නැංවීම

# පෙරවදන

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් 2010 වසරේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයෙන් ලැබුණු තොරතුරු පාදක කරගෙන 2014 වර්ෂයේ ඇස්තමේන්තු ගත මුළු රබර් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 134137 ක් වේ. එම බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර 85100 ක් කුඩා රබර් වතු අංශයට ද, හෙක්ටයාර 49037 ක් වතු සමාගම් සඳහා ද අයත් වේ. වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 98573 ක් වු අතර මෙය පෙර වර්ෂය සමඟ සැසඳීමේ දී 24% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මුළු රබර් නිෂ්පාදනයෙන් 49% ක් ෂීට් රබර් වන අතර 28% ක ප්‍රතිශතයක් රබර් කිරි නිෂ්පාදනය හා 15% ක ප්‍රතිශතයක් ක්‍රේප් රබර් නිෂ්පාදනයට හා 8%ක ප්‍රතිශතයක් බ්ලොක් රබර් නිෂ්පාදනය සඳහාද වෙන් වී ඇත. මුළු රබර් නිෂ්පාදනයෙන් 13% අපනයනය කර ඇති අතර 87% දේශීය කර්මාන්තකරුවන් විසින් පරිභෝජනය කර තිබේ. අමු රබර් අපනයනයේ මුළු වටිනාකම රු. මි. 5916.12 කි. පකිස්තානය, ඉන්දියාව, ජර්මනිය, මැලේසියාව හා ජපානය, අමු රබර් මිලදී ගන්නා ප්‍රධාන රටවල් වන අතර එම රටවල් මිලදී ගත් රබර් ප්‍රමාණය මුළු අපනයන ප්‍රමාණයෙන් 54% කි. 2014 වර්ෂයේ ෂීට් රබර් කිලෝ ග්‍රෑම් 1 ක සාමාන්‍ය මිල රුපියල් 285.76 ක් වූ අතර එය පෙර වර්ෂයට වඩා 24% ක මිල පහළ යාමක් විය.

රජයේ මැදිහත්වීම මත රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද පියවරයන් රබර් කර්මාන්තයේ දියුණුවට බොහෝ දුරට ඉවහල්වී ඇත. 2014 වර්ෂය සඳහා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට රුපියල් මිලියන 1098.80 ක ප්‍රතිපාදන වෙන් වූ අතර රුපියල් මිලියන 1071.57 ක වියදමක් දරා ඇති අතර ප්‍රගතිය 98% ක් විය. රජයේ තවාන් වල වසරේ පැළ නිෂ්පාදනය මිලියන 2.28 ක් වූ අතර බෙදා හැරි ප්‍රමාණය පැළ මිලියන 1.37 ක් විය.

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ මොණරාගල, හම්බන්තොට මෙන්ම අම්පාර, අනුරාධපුර, පොළොන්නරුව දිස්ත්‍රික්කයන් වලද, සාමකාමී වාතාවරණයක් තුල උතුරු පළාත් සංවර්ධනය කිරීමේ වැඩසටහනට දායක වෙමින් වවුනියා දිස්ත්‍රික්කයේ වවුනියාව හා නැදුන්කර්නි ප්‍රදේශ වලටද, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන් ප්‍රදේශයේ ද නව රබර් වගාව ආරම්භ කිරීමට 2011 වසරේදී ආරම්භ කරන ලද කටයුතු තවදුරටත් ක්‍රියාත්මක කිරීම 2014 වසරේදී ද සිදු කරන ලදී.

දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේද රබර් වගාවේ සංවර්ධනය උදෙසා සාම්ප්‍රදායිකව රබර් වගා කරන ප්‍රදේශවල සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන අම්පාර, මොණරාගල, බදුල්ල, හම්බන්තොට, වවුනියාව යන දිස්ත්‍රික්ක ඇතුළු රබර් වගා කරන සම්ප්‍රදායික ප්‍රදේශ වල ද පාළු සිටුවීම සඳහා රබර් පැළ 130955 ක් සපයන ලද අතර අතුරු බෝග වගාව සඳහා කෙසෙල් පැළ 12359 ක් හා අන්නාසි පැළ 51079 ක් සපයන ලදී.

ඒ සඳහා විවිධාකාරයෙන් සහාය ලබාදුන් සැමට මාගේ ස්තුතිය පුද කරමි.

ආර්. බී. ප්‍රේමදාස

අධ්‍යක්ෂ ජනරාල්

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# ස්තූතිය

2014 වර්ෂ සඳහා භාණ්ඩාගාරය විසින් ලබා දෙන ලද මුදල් සියල්ලම පාහේ වියදම් කිරීමට හැකි වූ සුවිශේෂී වසරක් විය.මෙම මුදල් ආයෝජනය කිරීමෙන් වගා සංවර්ධනය කිරීම, මිනිස් සම්පත් දියුණු කිරීම, භෞතික සම්පත් සංවර්ධනය කිරීම, වැඩි දායකත්වය සහ ඇපකැප වීම, සේවක තෘප්තිය යනාදී කරුණු අතින් ඉහළම ස්ථානයකට පැමිණීමට සමත් වීමු. ඒ සඳහා විවිධාකාරයෙන් සහාය දුන් කාර්ය මණ්ඩලයේ සියළු දෙනාට අපගේ හෘදයාංගම ස්තූතිය පළ කරමු.

ආර්.බී. ප්‍රේමදාස

අධ්‍යක්ෂ ජනරාල්

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

# පටුන


1. හැඳින්වීම 1
- 1.1. ඓතිහාසික පසුබිම 1-2
- 1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර 2-3
- 1.3. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 3-4
- 1.4. දෙපාර්තුමේන්තු ආයතනික ව්‍යුහය 5
- 1.5. සංවිධාන ව්‍යුහය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 6
- 1.6. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු 7

2. කාර්ය සාධන ප්‍රගතිය - 2014 වසර 8
- 2.1. රබර් වගා සහනාධාර වැඩසටහන 8
- 2.2. පැළ නිෂ්පාදනය 9
- 2.3. වැහි ආවරණ යෙදීමේ වැඩසටහන 9
- 2.4. අතුරු බෝග වැඩසටහන 9
- 2.5. පුහුණු වැඩසටහන් 10
- 2.6. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා කිරීම 10
- 2.7. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන 11-12

3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු 2014 13
- 3.1. රබර් වගා බිම් ප්‍රමාණය 13
- 3.2. නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම 14-16
- 3.3. දේශීය රබර් පරිභෝජනය 17
- 3.4. අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය 17-19
- 3.5. රබර් ආනයනය කළ ප්‍රමාණයන් 19-20
- 3.6. රබර් මිල 20-21
- 3.7. රබර් වෙළඳුන් 22
- 3.8. රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය 22-23
- 3.9. "මහින්ද චින්තනය" ඉදිරි දැක්ම හා රජයේ මධ්‍යකාලීන ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය 23-28
- 3.10. කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන 29
- 3.11. රබර් පැළ තවාන් සහ පැළ සැපයීම් 29-31
- 3.12. අතුරු බෝග වගාව 32-33
- 3.13. වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම 33-34
- 3.14. තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු 34
- 3.15. අන්තර් ජාතික කටයුතු 35

3.16. නෛතික කටයුතු 35-36
3.17. සහනාධාර ගෙවීම් 36
3.18. විශේෂ සංවර්ධන වැඩසටහන් 37-38
3.19. ඒකාබද්ධ අරමුදල 39
3.20. සෙස් බදු පිළිබඳ කටයුතු 40-41
3.21. නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය 41
3.22. අභ්‍යන්තර විගණන කටයුතු 42
3.23. ප්‍රචාරක අංශය මගින් ඉටු කරන ලද කාර්යන් 43
3.24. පරිගණක අංශය මගින් ඉටු කරන ලද කාර්යන් 44

4. ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය 45
4.1. රබර් නව වගා ප්‍රගතිය 45
4.2. රබර් නැවත වගා ප්‍රගතිය 45
4.3. අතුරුබෝග වගා ප්‍රගතිය 46
4.4. වැහි ආවරණ යෙදීම 46
4.5. කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන 47
4.6. කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන 47
4.7. බද්ධකරුවන් පුහුණු වැඩසටහන 48

5. අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම 49

# 1. හැඳින්වීම

දශක ගණනාවක සිට ශ්‍රී ලංකාවට විදේශ විනිමය ලබා දෙන ප්‍රධාන ආර්ථික වැවිලි බෝගයක් ලෙසට රබර් වගාව මෙරට ආර්ථිකයට ශක්තිමත් දායකත්වයක් ලබා දී ඇත. ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකාවේ පරිපාලන දිස්ත්‍රික්ක දහ හතරක රබර් වගාව ව්‍යාප්ත වී ඇති අතර මේ වන විට මුලතිව්, වවුනියාව, පොළොන්නරුව හා අනුරාධපුර යන දිස්ත්‍රික්ක වලටද රබර් වගාව හඳුන්වා දී ඇත.

## 1.1. ඓතිහාසික පසුබිම

රබර් ශාකය හෙවියා බ්‍රසියලියන්සිස් *(Havea brasialiensis)* යන උද්භිද විද්‍යාත්මක නාමයෙන් හඳුන්වනු ලැබේ. බ්‍රසීලයේ වැසි වනාන්තර වල ස්වාභාවිකව වැඩුනු මෙම ශාකයෙන් ලබා ගන්නා රබර් කිරි මේ වන විට මුළු මහත් ලෝකයේම නිෂ්පාදන රාශියකට යොදා ගන්නා ස්වාභාවික අමු ද්‍රව්‍යයක් බවට පත්ව ඇත.

බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ එනම් 1876 වර්ෂයේ "හෙන්රි වික්හෙම්" නැමැති ඉංග්‍රිසි ජාතිකයා මුල්ම රබර් පැළය ගම්පහ හෙනරත්ගොඩ උද්භිද උද්‍යානයේ රෝපණය කරමින් ශ්‍රී ලංකාවට රබර් ගස හඳුන්වා දෙන ලදී. ඉන් වසර 07 කින් පසු ඇරඹුණු රබර් වගාව දකුණු ආසියාව පුරා ව්‍යාප්ත වී රබර් නිෂ්පාදනය, සීඝ්‍රයෙන් ඉහළ ගියේය. ඊට ප්‍රතිලෝමව රබර් මිල පහළ යාම නිසාම මිල ස්ථාවර කිරීමේ අරමුණින් බ්‍රිතාන්‍යයන් විසින් 1922 දී "ස්ටීවන්සන් පටිපාටිය" හඳුන්වා දුනි. නිෂ්පාදන පංගු ක්‍රමයක් හා අළුතින් රබර් වැවීම සීමා කිරීම් සහිතවූ එම පටිපාටියට රබර් වගා කරුවන්ගෙන්ම ඇතිවූ විරෝධය නිසා 1928 දී අත්හිටුවීය. එසැනින්ම නැවත රබර් සැපයුම වැඩිවී මිල පහළ යාමෙන් පසු 1934 දී රබර් කර්මාන්තයට සම්බන්ධිත සියලු රටවල්වල එකඟතාවයෙන් " International Rubber Regulation Agreement " නැමති ගිවිසුම අත්සන් කෙරිණි. ස්ටීවන්සන් පටිපාටියට සමානවූ කොන්දේසි වලින් සමන්විත එම ගිවිසුමේ වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා රබර් වවන රටවල රබර් පාලනය සඳහා රාජ්‍ය ආයතන බිහි කරන ලදී. ඒ අනුව " 1934 දී අංක 06 දරණ ආඥා පනත " මගින් රබර් පාලන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම දෙපාර්තමේන්තුවේ මුල්ම රබර් පාලකවරයා වූයේ පී. සරවනමුත්තු මැතිතුමාය.

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" සම්මත කර ගන්නා ලදී. රබර් නැවත වගාවට ඉඩ සැලසෙන අයුරින් "1934 අංක 06 දරණ රබර් පාලන ආඥා පනත" ප්‍රතිශෝධනය කරමින් "1956 අංක 11 දරණ රබර් පාලන පනත" සම්මත කරගත් අතර එම පනත හා "1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත" ට අදාල රාජකාරි රබර් පාලන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදි.

රබර් පාලන දෙපාර්තමේන්තුවේ කටයුතු තවදුරටත් පුළුල් කරමින් 1994 වසරේදී එතෙක් පැවති රබර් පාලන දෙපාර්තමේන්තුව අහෝසි කර අමාත්‍ය මණ්ඩල තීරණයක් පරිදි රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදි. මේ අනුව එතෙක් පැවති රාජකාරි වලට අමතරව රබර් වගා ක්ෂේත්‍රයේ සංවර්ධනයට ඉවහල් වන ව්‍යාප්ති සේවා, පැළ නිෂ්පාදනය හා පොහොර බෙදීම වැනි

වඩාත් පුළුල් පරාසයක විහිදුනු සේවාවක් සැපයීමට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට හැකි වී ඇත.

තවද මෙම දෙපාර්තමේන්තුවට රබර් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විද්‍යාත්මක හා තාක්ෂණික උපදෙස් ලබා දෙමින් ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනයත්, කුඩා ඉඩම් හිමියන්ට අලෙවි හා ව්‍යාප්ති සේවා ලබා දෙමින් තුරුසවිය අරමුදලත් දායකත්වය ලබා දෙනු ලැබේ.

## 1.2. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට අදාල ප්‍රධාන හා වැදගත් නෛතික මූලාශ්‍ර

### 1.2.1. 1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනත;

මේ පනත යටතේ රබර් නැවත වගා කිරීම, රබර් නව වගාව, අතුරු බෝග වගාව, කර්මාන්ත ශාලා නවීකරණය හා ක්‍රම පාලනය යන කටයුතු ක්‍රියාත්මක වේ. තවද මෙම පනතේ 7 වගන්තිය යටතේ සෙස් බද්ද පනවා ඇත.

1953 අංක 36 දරණ රබර් නැවත වගා අරමුදල් පනතේ 7 වන වගන්තිය අනුව අපනයන බදු අය කිරීමට නීතිමය ප්‍රතිපාදන සැලසී තිබිණ. මේ අනුව පිටරට යවනු ලැබූ සෑම රබර් රාත්තලක් සඳහාම ශත 10 ක මුදලක් අපනයන බදු ලෙස අය කර ගෙන ඇත.

### 1.2.2. 1956 අංක 11 දරණ රබර් පාලන පනත

රබර් පාලන පනතේ විධි විධාන යටතේ මෙරට පවත්නා සියලුම කුඩා රබර් ඉඩම් හා රබර් වතුවල වගාව, අයිතිකරුවන්, බිම් ප්‍රමාණ ආදිය සටහන් වන ලේඛනයක් පවත්වාගන යෑම රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යයකි. රබර් පාලන පනත යටතේ රබර් වගාව පවතින අක්කර 10 ට වැඩි ( හෙක්ටයාර 4.04 ට වැඩි ) රබර් වගාවක් "වත්තක් " ලෙසත්, අක්කර 10 ට අඩු (හෙක්ටයාර 4.04 ට අඩු) රබර් වගාවක් "කුඩා ඉඩමක්" ලෙසත් අර්ථකථනය කර ඇත.

### 1.2.3. 2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ( සංශෝධිත ) පනත

2006 අංක 20 දරණ රබර් නැවත වගා කිරීමේ සහනාධාර (සංශෝධිත) පනතට අනුව , දේශීයව පරිභෝජනයට ගන්නා අමු ස්වභාවික රබර් හා කෘත්‍රිම රබර් මත සෙස් බදු අය කිරීමට ප්‍රතිපාදන සලසා ඇත.

2007 අංක 01 දරණ සෙස් බදු නියෝග ක්‍රියාත්මක වීමට පෙර සෙස් බදු අය කරනු ලැබුවේ ආනයනය හා අපනයනය කරනු ලැබූ ස්වභාවික අමු රබර් හා රබර් ආශ්‍රිත භාණ්ඩ මතය.

2007 අංක 01 දරණ ස්වභාවික රබර් සඳහා වූ සෙස් බදු නියෝග ඇතුලත් 2007 අගෝස්තු 30 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1518/18 දරණ අති විශේෂ ගැසට් පත්‍රයට අනුව අපනයනය කිරීම සඳහා හෝ දේශීය පරිභෝජනය පිණිස නිෂ්පාදනය කරන

ස්වභාවික රබර් ආශ්‍රිත නිෂ්පාදන සඳහා අවශ්‍ය අමු රබර් මත කිලෝ ග්‍රෑමයකට රු 4 ක සෙස් බද්දක් අය කිරීමට මෙමගින් ප්‍රතිපාදන සලසා දී ඇත.

මෙහිදී සෘජුවම මෙම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉහත සෙස් බදු මුදල අයකර ගැනීමට බලතල හිමිවී ඇත.

## 1.3. රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ආයතනයක් වන මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ 02, වෝක්ෂෝල් පටුමග, අංක 55/75 දරණ ස්ථානයේ පිහිටුවා ඇත. ප්‍රධාන කාර්යාලය විසින් පරිපාලන, මෙහෙයුම්, සෙස් බදු එක් රැස් කිරීම හා අනෙකුත් ආයතන සමග සම්බන්ධීකරණ කටයුතු සිදුකරයි. සහනාධාර ගෙවීම, පැළ නිෂ්පාදනය කර බෙදා හැරීම, පොහොර බෙදා හැරීම හා උපදේශන සේවා වැනි රබර් වගාවේ සංවර්ධනය සඳහා ඉටු කරන සේවාවන් ජනතාව වෙත වඩාත් කාර්යක්ෂමව ලබා දීමේ අරමුණින් දෙපාර්තමේන්තුවේ කටයුතු විමධ්‍යගත කර ඇති අතර ඒ අනුව ප්‍රාදේශීය කාර්යාල 5ක් පිහිටුවා ඇත.

1. කෑගල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (කෑගල්ල, කුරුණෑගල, මහනුවර, මාතලේ හා ගම්පහ දිස්ත්‍රික්ක සඳහා)

2. කළුතර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (කළුතර දිස්ත්‍රික්කය සඳහා)

3. රත්නපුර ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (රත්නපුර හා කොළඹ දිස්ත්‍රික්ක සඳහා)

4. ගාල්ල ප්‍රාදේශීය නියෝජ්‍ය අධ්‍යක්ෂ කාර්යාලය
   (ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක සඳහා)

5. මොණරාගල ප්‍රාදේශීය සහකාර අධ්‍යක්ෂ කාර්යාලය
   (මොණරාගල, බදුල්ල හා අම්පාර දිස්ත්‍රික්ක සඳහා)

තවද රබර් වගාව සඳහා ගුණාත්මක බද්ධ රබර් පැළ නිෂ්පාදනය සඳහා රජයේ පැළ තවාන් 08 ක් ස්ථාපනය කර ඇත.

1. මීරිගම (ගම්පහ දිස්ත්‍රික්කය)
2. වැලිකඩමුල්ල (ගම්පහ දිස්ත්‍රික්කය)
3. ඇගල් ඔය (කළුතර දිස්ත්‍රික්කය)


4. ගුරුගොඩ (කළුතර දිස්ත්‍රික්කය)

5. කරපිංච (රත්නපුර දිස්ත්‍රික්කය)

6. කුඹුක්කන (මොණරාගල දිස්ත්‍රික්කය)

7. මිද්දෙණිය (හම්බන්තොට දිස්ත්‍රික්කය)

8. පදියතලා (අම්පාර දිස්ත්‍රික්කය)



ගුරුගොඩ රබර් පැළ තවාන




කුඹුක්කන පැළ තවාන




කුඹුක්කන රබර් පැළ තවාන

## 1.4. දෙපාර්තමේන්තු ආයතන ව්‍යුහය



## 1.5. සංවිධාන ව්‍යුහය රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව



## 1.6. දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල තොරතුරු

| අනු අංකය | තනතුර | අනුමත කාර්යය මණ්ඩලය | දැනට සිටින කාර්යය මණ්ඩලය | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් - ශ්‍රී ලං.ප.සේ | 1 | 1 | - |
| 02 | අධ්‍යක්ෂ - ශ්‍රී ලං.ප.සේ | 2 | 1 | 1 |
| 03 | ප්‍රධාන ගණකාධිකාරි ශ්‍රී ලං.ග.සේ | 1 | 1 | - |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ශ්‍රී ලං.ප.සේ , සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලං.ප.සේ | 16 | 14 | 2 |
| 05 | සහකාර අධ්‍යක්ෂ - ශ්‍රී ලං.කෘ.සේ | 1 | 1 | - |
| 06 | ගණකාධිකාරි - ශ්‍රී ලං.ග.සේ | 6 | 3 | 3 |
| 07 | සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ | 2 | 1 | 1 |
| 08 | අභ්‍යන්තර විගණක | 1 | 1 | - |
| 09 | පරිපාලන නිලධාරි | 4 | 3 | 1 |
| 10 | ප්‍රචාරක නිලධාරි | 1 | 1 | - |
| 11 | අයවැය සහකාර | 1 | 1 | - |
| 12 | සංවර්ධන නිළධාරි/උපාධිධාරී සහකාර | 22 | 20 | 2 |
| 13 | තවාන් කළමණාකරු | 7 | 6 | 1 |
| 14 | රබර් සංවර්ධන නිලධාරි : විශේෂ (අධිශ්‍රේණි) | 12 | - | 12 |
| 15 | සංවර්ධන සහකාර | 05 | 05 | - |
| 16 | ගොඩනැගිලි නඩත්තු නිලධාරි | 1 | 1 | - |
| 17 | රාජ්‍ය කළමණාකරණ සහකාර | 139 | 121 | 18 |
| 18 | තොරතුරු සන්නිවේදන තාක්ෂණ සහකාර | 5 | 2 | 3 |
| 19 | ලිපිකරු | 14 | 14 | - |
| 20 | විගණක ලිපිකරු | 1 | 1 | - |
| 21 | රබර් සංවර්ධන නිලධාරි | 182 | 95 | 87 |
| 22 | කාර්යාල සේවක සේවය | 28 | 26 | 2 |
| 23 | රියදුරු | 36 | 36 | - |
| 24 | ලොරි සහායක | 8 | 8 | - |

**කාර්ය මණ්ඩලය සංඛ්‍යා සටහන i**

# 2. කාර්ය සාධන ප්‍රගතිය - 2014 වසර

රබර් කර්මාන්තයේ උන්නතිය උදෙසා මෙම දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් කාර්යන් ප්‍රධාන වශයෙන් ඉටු කරන ලදි.

- රබර් වගා සහනාධාර වැඩසටහන
- පැළ නිෂ්පාදනය.
- වැහි ආවරණ යෙදීමේ වැඩසටහන
- අතුරු බෝග වැඩසටහන
- පුහුණු වැඩසටහන්
- දිවි නැගුම ජාතික සංවර්ධන වැඩසටහන

## 2.1. රබර් වගා සහනාධාර වැඩසටහන

රබර් නව වගා වැඩසටහන යටතේ සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල කුඩාවතු සඳහා 2014 වර්ෂයේදී හෙක් 7590 ක ඉලක්කයක් පැවති අතර ඉන් හෙක් 1428 ක් වගා කල අතර, මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් රබර් වගා කිරීමේ (IFAD) විදේශාධාර ව්‍යාපෘතිය යටතේ මෙම වර්ෂයේද හෙක් 110 ක් වගා කරන ලදී. මේ අනුව සම්ප්‍රදායික හා සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල කුඩාවතු වල රබර් නව වගාව සඳහා සහනාධාර වශයෙන් රු. මි. 213.47 ක් ගෙවා ඇත.

රබර් නැවත වගා වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 2050 ඉලක්කයක් පැවති අතර හෙක්ටයාර 1342.91 ක් වගා කරන ලදී. වැවිලි සමාගම් යටතේ හෙක් 1640 ඉලක්කයක් පැවති අතර හෙක් 753.39 ක්ද වගා කරන ලදී. ඒ අනුව රබර් නැවත වගාව යටතේ වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 2096 කි. රබර් නැවත වගා වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 353.80 ක් ගෙවා ඇත.



කිරි කපන රබර් වගාවක් - මොනරාගල

## 2.2. පැල නිෂ්පාදනය

දෙපාර්තාමේන්තුව මගින් තවාන් 08 ක් ස්ථාපනය කර ඇති අතර ඉන් තවාන් 07 ක් මගින් පැළ නිෂ්පාදනය කර බෙදා හැරීම සිදු කරනු ලබයි. අම්පාර දිස්ත්‍රික්කයේ අළුතින් ස්ථාපනය කර ඇති පදියතලාව පැළ තවානේ පැළ නිෂ්පාදන කටයුතු 2015 වර්ෂයේදී සිදු කිරීමට නියමිතව ඇත.

## 2.3. වැහි ආවරණ යෙදීමේ වැඩසටහන

වැහි ආවරණ යෙදීමේ වැඩසටහන යටතේ කුඩා වතු සඳහා හෙක් 1500 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 308.88 ක් සඳහා වැහි ආවරණ යොදන ලදී. කුඩා වතු සඳහා සහනාධාර වශයෙන් රු. මි. 4.29 ද වැවිලි සමාගම් සඳහා හෙක් 5000 ක ඉලක්කයක් පැවති අතර හෙක්. 4060.47 ක් සඳහා වැහි ආවරණ යොදා ඇත. සහනාධාර වශයෙන් රු. මි. 22.48 ක මුදලක් වැය කරන ලදී.



වැහි ආවරණ යොදන ලද රබර් ඉඩමක්

## 2.4. අතුරු බෝග වැඩසටහන

අපරිණත රබර් වගාව සමග රබර් වගා කරුවන්ට අතිරේක ආදායමක් ලබා ගැනීම සඳහා අතුරු බෝග වගා කිරීමේ වැඩසටහන යටතේ හෙක් 600 ක ඉලක්කයක් පැවති අතර එයින් හෙක් 364.13 ක් වගා කරන ලදී. අතුරු බෝග වැඩසටහන සඳහා සහනාධාර වශයෙන් රු. මි. 1.33 ක මුදලක් කුඩා රබර් ඉඩම් හිමියන් වෙත ගෙවා ඇත.



රබර් සමග කෙසෙල් වගා කල ඉඩමක්



රබර් සමග අන්නාසි වගා කල ඉඩමක්

## 2.5. පුහුණු වැඩසටහන්

පුහුණු වැඩසටහන් වශයෙන් කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සාමාන්‍ය, වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන හා බද්ධ කරුවන් පුහුණු කිරීම පවත්වන ලදී. කිරි කැපුම් ශිල්පීන් පුහුණු වැඩසටහන යටතේ සාමාන්‍ය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 2900 වූ අතර එයින් 2721 දෙනෙකු පුහුණු කරන ලදී. කිරිකැපුම් ශිල්පී සාමාන්‍ය වැඩසටහන සඳහා රු.මි. 1.78 ක් වියදම් කරන ලදී. වෘත්තීය කිරි කැපුම් ශිල්පීන් සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 330 වූ අතර මෙම වර්ෂයේදී 333 දෙනෙකු මේ සඳහාද පුහුණු කරවන ලදී. වෘත්තීය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන සඳහා රු.මි. 2.83 වියදම් කරන ලදී. මෙහිදීද ඉලක්කය ඉක්මවා ප්‍රගතිය වාර්තා කිරීම මෙම වසරේදී කැපී පෙනෙන ලක්ෂණයකි. බද්ධකරුවන් පුහුණු කිරීම සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 270 වූ අතර එයින් 273 දෙනෙකු පුහුණු කරවන ලදී. බද්ධකරුවන් පුහුණු වැඩසටහන සඳහා රු. මි. 0.22 ක් වියදම් කරන ලදී. රබර් සංවර්ධන නිළධාරීන්ගේ ක්ෂේත්‍ර නිළධාරි පුහුණුව සඳහා ඉලක්ක ප්‍රමාණය 108 ක් වූ අතර ඉන් 98 දෙනෙක් පුහුණුව සඳහා සහභාගි වි ඇත.ඒ සඳහා රු.මි. 0.81 වැය වී ඇත.



කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහනක්


## 2.6. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා කිරීම

සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී මොණරාගල හෙක් 235.93 ක්ද අම්පාර හෙක් 256.17 ක්ද, බදුල්ල හෙක් 83.87 ක්ද, වවුනියාව හෙක් 12.14 ක්ද අනුරාධපුර හෙක් 0.4 ක්ද, හම්බන්තොට හෙක් 5.03 ක්ද වශයෙන් සම්ප්‍රදායික නොවන ප්‍රදේශවල මෙම වසරේදී වගා කරන ලද මුළු බිම් ප්‍රමාණය හෙක් 593.54 වේ.



සම්ප්‍රදායික නොවන ප්‍රදේශයක ඇති රබර් ඉඩමක්

## 2.7. දිවිනැඟුම ජාතික සංවර්ධන වැඩසටහන



**2.7.1.** මෙම වැඩසටහන යටතේ පාළු සිටුවීම සඳහා රබර් පැළ 100,000 ඉලක්කයක් පැවති අතර පැළ 130,955 ක් සාම්ප්‍රදායික රබර් වගා කරන ප්‍රදේශවල සහ සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන වවුනියාව, අම්පාර, බදුල්ල, මොණරාගල, හම්බන්තොට යන දිස්ත්‍රික්කවලට බෙදා දෙන ලදී. ඒ සඳහා මෙම වර්ෂයේදී රු. මි. 7.86 ක මුදලක් වැය කරන ලදී.

**2.7.2.** අපරිණත රබර් වගා බිම් වල අතුරු බෝග ලෙස වගා කිරීමට කෙසෙල් පැළ, අන්නාසි පැළ නොමිලේ ලබා දෙන ලද ලදී. මෙහිදී කෙසෙල් පැළ 12359, අන්නාසි පැළ 51079 ක් වශයෙන් එකතුව පැළ 63438 ක් බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 1.73 කි.

**2.7.3**. කිරි කැපුම් ශිල්පී පුහුණුව වැඩසටහන් වලට සහභාගි වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීමේ වැඩසටහනෙහි මෙම වසරේදී පුහුණුව සඳහා ඉලක්කගත පුද්ගලයින් සංඛ්‍යාව 3230 ක් වූ අතර පුහුණුව අවසන් කළ පුද්ගලයින් 3027 දෙනෙකුට කිරි පිහි බෙදා දෙන ලදී. ඒ සඳහා වැය කල මුදල රු. මි. 0.87 කි.

**2.7.4**. දිවිනැගුම වැඩසටහන යටතේ රජයේ රබර් පැළ තවාන් සංවර්ධනය කිරීමේ වැඩසටහන මෙම වසරේදීද ක්‍රියාත්මක කරන ලදී. මේ යටතේ දිස්ත්‍රික්ක පහක ඇති තවාන් 7 හි හඳුනාගත් සංවර්ධන කටයුතු සාර්ථකව නිම කරන ලදී. මේ සඳහා රු.මි 2.07 ක මුදලක් වැය කරන ලදී.

# 3. ස්වභාවික රබර් කර්මාන්තය ආශ්‍රිත තොරතුරු - 2014 වසර

පසුගිය වසර කිහිපයේ රබර් වගා බිම් ප්‍රමාණයේ ක්‍රමික වර්ධනයක් පෙන්නුම් කෙරේ. 2014 වර්ෂයේ දිවයිනෙහි ඇස්තමේන්තු ගත මුළු රබර් බිම් ප්‍රමාණය 2010 වර්ෂයේ පවත්වන ලද රබර් ඉඩම් සංගණනයේ ප්‍රතිඵල පදනම් කොට ගණනය ක ර ඇත.

## 3.1. රබර් වගා බිම් ප්‍රමාණය

**රබර් වගා බිම් ප්‍රමාණය- 2014 වර්ෂය**

| | පෞද්ගලික අංශය (හෙක්ටයාර් 20 ට අඩු ඉඩම්) හෙක්. | ප්‍රාදේශිය වැවිලි සමාගම් (හෙක්ටයාර් 20 ට වැඩි ඉඩම්) හෙක්. | එකතුව හෙක්. |
|---|---|---|---|
| 2010 වර්ෂයේ රබර් ඉඩම් සංගණනයෙන් වාර්තා වු බිම් ප්‍රමාණය | 79,395 | 46,250 | 125,645 |
| 2011 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 80,018 | 48,516 | 128,534 |
| 2012 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 82,170 | 48,610 | 130,780 |
| 2013 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 85,083 | 48,585 | 133,668 |
| 2014 වර්ෂයේ ඇස්තමේන්තු ගත බිම් ප්‍රමාණය | 85,100 | 49,037 | 134,137 |

**සංඛ්‍යා සටහන ii**

රබර් වගාව පවතින බිම් ප්‍රමාණයෙන් 63.44% ක් කුඩා හා මධ්‍යම ප්‍රමාණයේ ඉඩම් කට්ටි වශයෙන්ද, ඉතිරි 36.56% ප්‍රමාණය වැවිලි සමාගම් වතු වශයෙන්ද පවතී. මෙම බිම් ප්‍රමාණයෙන් අපරිණත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 23,237 ක්ද, කිරි කපන පරිණත බිම් ප්‍රමාණය හෙක්ටයාර් 110,900 ක්ද ලෙස ඇස්තමේන්තු කර ඇති අතර, එම වගාවෙන් ලත් මුළු නිෂ්පාදන ප්‍රමාණය මෙට්‍රික් ටොන් 98,573 ක් වේ. 2014 වර්ෂයේ රබර් හෙක්ටයාරයක සාමාන්‍ය වාර්ෂික අස්වැන්න වියලි රබර් කිලෝ ග්‍රෑම් 889 ක් ලෙසද ඇස්තමේන්තු කර ඇත.

කුඩා වතු අංශයේ හෙක්. 85,100 න් පරිණත වගා බිම් ප්‍රමාණය හෙක්. 74,650 ක් ද අපරිණත වගාව හෙක්. 10,450 ක්ද වැවිලි සමාගම් වල හෙක්. 49,037 න් පරිණත වගා බිම් ප්‍රමාණය හෙක්. 36,247 ක් ද අපරිණත වගාව හෙක්. 12,790ක් ද වශයෙන් වේ.

## 3.2. නිෂ්පාදනය හා නිෂ්පාදන වියදම

### 3.2.1. රබර් නිෂ්පාදනය

2014 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 98,573 කි. පෙර වර්ෂයේ මුළු නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 130,421 හා සසඳන විට කිලෝග්රෑම් 31,848 ක අඩුවීමක් දක්නට ඇත. එය පෙර වර්ෂය හා සසඳන කල 24.42% ක අඩුවීමක් පෙන්නුම් කරයි. මෙලෙස නිෂ්පාදනය අඩු වීමට බල පෑ ප්‍රධාන හේතූන් වන්නේ 2013 වර්ෂයට සාපේක්ෂව රබර් මිල පහළ යාම හා අධික වර්ෂාව පැවතීමයි. 2014 වර්ෂයේ කුඩා වතු අංශයේ නිෂ්පාදනය මෙ.ටො. 76,073 ක් ව අතර වැවිලි සමාගම් වල නිෂ්පාදනය මෙ.ටො. 22,500 ක් වේ.

**2013 සහ 2014 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | ස්ක්‍රැප් ක්‍රේප් | සෝල් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් T.S.R | ලේටෙක්ස් සහ වෙනත් | එකතුව |
|---|---|---|---|---|---|---|---|
| 2013 | 62,800 | 2,379 | 2,440 | 15,373 | 9,566 | 37,863 | 130,421 |
| 2014 | 48,539 | 1,022 | 2,410 | 11,832 | 7,615 | 27,155 | 98,573 |

**සංඛ්‍යා සටහන iii**



ෂීට් රබර් නිෂ්පාදනය



ක්‍රේප් රබර් නිෂ්පාදනය

**2014 වර්ෂයේ දිස්ත්‍රික්ක වශයෙන් රබර් නිෂ්පාදනය**

| දිස්ත්‍රික්කය | දිස්ත්‍රික් නිෂ්පාදනය මෙ. ටො. | ජාතික නිෂ්පාදනයට දිස්ත්‍රික් දායකත්වය % |
|---|---|---|
| කළුතර | 23,894.90 | 24.24 |
| කෑගල්ල | 30,076.58 | 30.51 |
| ගම්පහ | 3,162.75 | 3.21 |
| කුරුණෑගල | 2,259.12 | 2.29 |
| මහනුවර | 1,538.80 | 1.56 |
| මාතලේ | 1,051.44 | 1.07 |
| රත්නපුර | 20,653.37 | 20.95 |
| ගාල්ල | 5,131.98 | 5.21 |
| මාතර | 3,512.81 | 3.56 |
| හම්බන්තොට | 67.42 | 0.07 |
| කොළඹ | 5,299.75 | 5.38 |
| මොණරාගල | 1,057.24 | 1.07 |
| බදුල්ල | 856.79 | 0.87 |
| පුත්තලම | 10.06 | 0.01 |
| **එකතුව** | **98,573.01** | **100.00** |

**සංඛ්‍යා සටහන iv**

### 3.2.2. නිෂ්පාදන වියදම

වියලි රබර් කිලෝ ග්‍රෑමයක් නිෂ්පාදනය සඳහා 2014 වර්ෂයේ කුඩා වතු අංශයේ සාමාන්‍ය නිෂ්පාදන වියදම රු. 160.00 කි. පෙර වර්ෂයේ නිෂ්පාදන වියදම ද රු. 150.00 කි. වතු සමාගම් සඳහා 2014 වර්ෂයේ නිෂ්පාදන වියදම රු. 280.00 ක් වන අතර, පෙර වර්ෂයේද එම අගය රු.245.00 ක් වේ. අස්වැන්න අඩු වීම නිසා නිෂ්පාදන වියදම වැඩි විය යුතුය. නිෂ්පාදන වියදම 2002 වසරේ සිට වර්ධනය වි ඇති ආකාරය සංඛ්‍යා සටහන් අංක **v** හි දක්වා ඇත.


**රබර් නිෂ්පාදන වියදම**

*(කි.ග්‍රෑම්1 ක්/රුපියල්)*

| වර්ෂය | වැවිලි සමාගම් | කුඩා වතු අංශය |
|---|---|---|
| 2002 | 55.74 | 54.00 |
| 2003 | 59.76 | 63.30 |
| 2004 | 65.98 | 73.37 |
| 2005 | 72.56 | 77.37 |
| 2006 | 87.65 | 97.20 |
| 2007 | 102.31 | 112.69 |
| 2008 | 119.89 | 114.00 |
| 2009 | 135.83 | 118.56 |
| 2010 | 158.94 | 119.83 |
| 2011 | 188.23 | 129.56 |
| 2012 | 207.00 | 136.00 |
| 2013 | 245.00 | 150.00 |
| 2014 | 280.00 | 160.00 |

**සංඛ්‍යා සටහන V**

**රබර් නිෂ්පාදන වියදම 2002 - 2014**



## 3.3. දේශීය රබර් පරිභෝජනය

මෙරට නිෂ්පාදිත ස්වභාවික රබර් අතීතයේ දි ප්‍රධාන වශයෙන් අපනයනය මත පදනම් වූ වැදගත් කාර්මික අමු ද්‍රව්‍යයක් ලෙස පැවති අතර, වර්තමානය වන විට එම තත්ත්වය ක්‍රමිකව වෙනස් වී දේශිය නිමි භාණ්ඩ නිෂ්පාදනය සඳහා වැඩි වශයෙන් රබර් භාවිතා කිරීමේ නැඹුරුතාවයක් දැක ගත හැකිය. ඒ අනුව 2014 වර්ෂයේදී දේශීය පරිභෝජනය ස්වභාවික රබර් මෙට්‍රික් ටොන් 85632 විය. මෙම ප්‍රමාණය 2014 වර්ෂයේ මුළු රබර් නිෂ්පාදනය වු මෙට්‍රික් ටොන් 98573 න් 86.87% කි. මෙම වර්ෂයේ රබර් නිෂ්පාදනය ගිය වසරට වඩා අඩු වී ඇති බැවින් පසුගිය වසරේ රබර් තොග වලින්ද දේශීය පරිභෝජනය හා අපනයනය සඳහා මේ වස වසරේදී යොදාගෙන ඇත. මෙම වර්ෂයේ ආනයනය කරන ලද රබර් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 29225.06 කි. මෙම ප්‍රමාණයද දේශීය රබර් පරිභෝජනය සඳහා යොදාගෙන ඇත.


## 3.4. අමු ද්‍රව්‍යයක් ලෙස ස්වාභාවික රබර් අපනයනය

පසුගිය 2013 වසර සමග සන්සන්දනය කිරීමේදී 2014 වර්ෂයේ ලංකාවේ රබර් අපනයනයේ කැපී පෙනෙන අඩු වීමක් සිදු වී ඇත.

**2013 සහ 2014 වර්ෂයන්හි ශ්‍රි ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන්**

| මාසය | නැව්ගත කළ ප්‍රමාණයන් (මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | 2013 වර්ෂය | 2014 වර්ෂය |
| ජනවාරි | 2,606 | 3,023 |
| පෙබරවාරි | 2,535 | 2,141 |
| මාර්තු | 2,373 | 1,808 |
| අප්‍රේල් | 1,793 | 1,613 |
| මැයි | 1,247 | 1,169 |
| ජූනි | 1,225 | 1,109 |
| ජූලි | 1,213 | 915 |
| අගෝස්තු | 1,799 | 1,071 |
| සැප්තැම්බර් | 1,912 | 895 |
| ඔක්තෝබර් | 2,082 | 898 |
| නොවැම්බර් | 1,937 | 705 |
| දෙසැම්බර් | 2,864 | 959 |
| **එකතුව** | **23,586** | **16,306** |

**සංඛ්‍යා සටහන vi**




**රබර් අපනයනය 2013 සහ 2014**

2013 සහ 2014 වර්ෂයන්හි ශ්‍රී ලංකාවේ අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව පහත සටහනේ දක්වා ඇත.

**2013 සහ 2014 වර්ෂයන්හි අපනයනය කළ රබර් ප්‍රමාණයන් වර්ග අනුව**

**(මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| 2013 | 4574 | 2022 | 17 | 13171 | 2397 | 1405 | **23586** |
| 2014 | 1967 | 2296 | 17 | 9860 | 913 | 1253 | **16306** |

**සංඛ්‍යා සටහන vii**

මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස (F.O.B) වටිනාකම සටහන **viii** හි දැක්වේ.

**මුළු අපනයන රබර් ප්‍රමාණයන්හි නැ.වි.ස වටිනාකම**

**(රුපියල් මිලියන)**

| වර්ෂය | අපනයන ප්‍රමාණය මෙට්‍රික් ටොන් | මුළු වටිනාකම රු.මිලියන | කි.ග්‍රෑම් 1ක වටිනාකම රු. ශත |
|---|---|---|---|
| 2013 | 23586 | 9194.00 | 390.00 |
| 2014 | 16306 | 5916.12 | 362.83 |

**සංඛ්‍යා සටහන viii**

රබර් අපනයනය ප්‍රධාන වශයෙන් පෞද්ගලික අංශය විසින් කරනු ලබයි. පෞද්ගලික අංශයෙහි ලියාපදිංචි අපනයන කරුවන් 114 දෙනෙකු සිටී. එම අපනයනකරුවන් 114 දෙනාම මෙම දෙපාර්තමේන්තුවේ 2014 වර්ෂය සඳහා ද ලියාපදිංචි කර ඇත.

**රබර් මිලයට ගන්නා ප්‍රධාන රටවල් 2014**

**(මෙට්‍රික් ටොන්)**

| රට | මිලයට ගත් ප්‍රමාණය | % |
|---|---|---|
| පකිස්තානය | 2425 | 15 |
| ඉංදියාව | 2018 | 12 |
| ජපානය | 1678 | 10 |
| ජර්මනිය | 1583 | 10 |
| මැලේසියාව | 1117 | 7 |
| ඉතාලිය | 970 | 6 |
| දකුණු අප්‍රිකාව | 763 | 5 |
| ඇමරිකාව | 711 | 4 |
| චීනය | 699 | 4 |
| හොංකොං | 256 | 2 |
| ස්පාංඤය | 159 | 1 |
| එක්සත් රාජධානිය | 138 | 1 |
| වෙනත් | 3789 | 23 |
| එකතුව | **16306** | **100** |

**සංඛ්‍යා සටහන ix**

## 3.5. රබර් ආනයනය කල ප්‍රමාණයන් - 2014 වර්ෂය

| මාසය | ප්‍රමාණය (මෙට්‍රික් ටොන්) |
|---|---|
| ජනවාරි | 540 |
| පෙබරවාරි | 0.06 |
| මාර්තු | 1114 |
| අප්‍රේල් | 1753 |
| මැයි | 381 |
| ජූනි | 1860 |
| ජූලි | 2657 |
| අගෝස්තු | 3510 |
| සැප්තැම්බර් | 3970 |
| ඔක්තෝබර් | 4549 |
| නොවැම්බර් | 5747 |
| දෙසැම්බර් | 3144 |
| **එකතුව** | 29,225.06 |

**සංඛ්‍යා සටහන x**

**2013 සහ 2014 වර්ෂයන්හි ආනයනය කළ ස්වභාවික රබර් ප්‍රමාණයන් වර්ග අනුව**

**(මෙට්‍රික් ටොන්)**

| වර්ෂය | ෂීට් රබර් | සෝල් ක්‍රේප් | ස්ක්‍රැප් ක්‍රේප් | ලේටෙක්ස් ක්‍රේප් | බ්ලොක් රබර් (T.S.R) | ලේටෙක්ස් සහ වෙනත් | **එකතුව** |
|---|---|---|---|---|---|---|---|
| 2013 | 7790 | 18 | 17 | 0 | 188 | 1886 | **9899.00** |
| 2014 | 21743 | 0 | 15 | 0 | 208 | 7259.06 | **29,225.06** |

**සංඛ්‍යා සටහන xi**

**මුළු රබර් ආනයනය - 2014**

**(මෙට්‍රික් ටොන්)**

| වර්ගය | ආනයනය කල ප්‍රමාණය මෙ. ටො. | ආනයන වටිනාකම රු. මි. |
|---|---|---|
| ස්වභාවික රබර් | 29225.1 | 7227.7 |
| කෘතිම රබර් | 42359.1 | 10580.1 |
| ප්‍රතිසැකසුම්කරන ලද රබර් | 17369.9 | 1548.9 |
| ස්ක්‍රේප් රබර් | 5924.0 | 395.3 |
| සංයුක්ත රබර් | 4563.1 | 1570.0 |
| අර්ධ නිමි රබර් | 5995.8 | 865.1 |
| නිමි භාණ්ඩ නිෂ්පාදනය | 7080.2 | 5580.1 |
| නිමි භාණ්ඩ නිෂ්පාදනය (ගණන) | 6013.7 | 9572.8 |

**සංඛ්‍යා සටහන xii**

## 3.6. රබර් මිල

ගෝලීය දළ ජාතික නිෂ්පාදනයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් ස්වාභාවික රබර් සඳහා වන ඉල්ලුම අඩු වීම නිසා 2011 වසරේ සිට රබර් මිල අඩු වෙමින් පවතින අතර 2013 හා 2014 වර්ෂ වල රබර් මිල පහත පරිදි වේ.

**රබර් වර්ග අනුව සාමාන්‍ය මිල**

*(කිලෝ 1ක් රුපියල්)*

| **වර්ෂය** | **වාර්ෂික සාමාන්‍ය මිල** | | |
|---|---|---|---|
| | **ෂීට් රබර් නො. 1** | **ස්ක්‍රැප් ක්‍රේප් නො.1.XBR** | **ලේටෙක්ස් ක්‍රේප් නො.1X** |
| 2013 | 376.78 | 309.04 | 397.33 |
| 2014 | 285.76 | 212.75 | 309.90 |

**සංඛ්‍යා සටහන xiii**

## 2014 වර්ෂයේ මාසික රබර් මිල

වාර්ෂික සාමාන්‍ය මිල

රුපියල්

| මාසය | ෂීට් රබර් (ආර් එස් එස්) | | | | | ලේටෙක්ස් ක්‍රේප් | | | | | ස්ක්‍රැප් ක්‍රේප් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 4 | 5 | IX | 1 | 2 | 3 | 4 | 1XBR | 2XBR | 3XBR | 4 | FB | SKIM |
| ජනවාරි | 321.34 | 316.50 | 275.05 | 283.80 | 275.00 | 348.75 | 340.50 | 322.13 | 297.63 | 273.21 | 256.25 | 252.57 | 237.41 | 227.49 | 214.68 | 205.86 |
| පෙබරවාරි | 294.69 | 284.00 | 278.12 | 272.42 | 274.00 | 320.43 | 314.14 | 281.50 | 270.75 | 256.19 | 243.68 | 233.67 | 214.77 | 209.28 | 197.50 | 197.13 |
| මාර්තු | 301.50 | 292.64 | 286.38 | 282.67 | 270.50 | 305.11 | 298.14 | 266.38 | 249.63 | 241.25 | 232.88 | 222.73 | 213.43 | 207.38 | 194.33 | 206.63 |
| අප්‍රේල් | 281.28 | 280.90 | 281.14 | 273.67 | 263.00 | 300.75 | 290.43 | 259.17 | 226.50 | 215.86 | 212.80 | 203.00 | 197.67 | 192.33 | unq | 198.55 |
| මැයි | 289.54 | 287.75 | 279.50 | 274.33 | 275.00 | 306.50 | 299.50 | 269.86 | 215.86 | 196.94 | 193.81 | 188.00 | 198.21 | 190.64 | 179.50 | 193.56 |
| ජූනි | 313.47 | 305.00 | 290.25 | 278.80 | 262.50 | 322.17 | 314.57 | 263.57 | 230.00 | 219.29 | 212.00 | 207.75 | 209.80 | 199.71 | 188.40 | 198.33 |
| ජූලි | 289.86 | 279.40 | 268.33 | 259.50 | 272.00 | 326.15 | 315.13 | 274.50 | 235.22 | 219.78 | 212.93 | 206.50 | 206.30 | 198.89 | 191.03 | 197.64 |
| අගෝස්තු | 263.52 | 256.00 | 257.00 | 254.25 | 242.00 | 296.67 | 287.20 | 257.31 | 231.25 | 205.31 | 197.63 | 190.00 | 193.36 | 185.40 | 176.00 | 185.67 |
| සැප්තැම්බර් | 261.08 | 256.06 | 240.50 | 238.00 | unq | 297.96 | 288.19 | 264.38 | 234.78 | 208.39 | 198.71 | 188.40 | 187.56 | 180.00 | 159.00 | 172.75 |
| ඔක්තෝබර් | 286.80 | 276.67 | 265.75 | 256.00 | unq | 292.60 | 287.63 | 268.00 | 244.00 | 205.63 | 199.83 | 195.00 | 192.14 | 184.56 | 177.75 | 173.75 |
| නොවැම්බර් | 263.21 | 257.78 | 252.00 | 250.50 | 245.00 | 306.00 | 301.28 | 275.25 | 257.06 | 207.69 | 198.06 | 193.30 | 186.17 | 182.21 | 176.67 | 169.43 |
| දෙසැම්බර් | 262.83 | 263.25 | 248.00 | 248.50 | 235.00 | 295.70 | 288.00 | 267.25 | 245.13 | 204.50 | 194.43 | 186.67 | 183.64 | 176.86 | 168.67 | 160.75 |
| සාමාන්‍ය | **285.76** | **279.75** | **268.50** | **264.37** | **262.40** | **309.90** | **302.06** | **272.44** | **244.82** | **221.17** | **212.75** | **205.63** | **201.71** | **194.56** | **183.96** | **188.34** |

**සංඛ්‍යා සටහන xiv**

## 3.7. රබර් වෙළඳුන්

රබර් වෙළඳාම සඳහා බලපත්‍රයක් ලබා ගැනීම නෛතික අවශ්‍යතාවයක් වන අතර 2014 වර්ෂයේ රබර් වෙළඳුන් 1033 ක් බලපත්‍ර අලුත් කර ඇති අතර, නව බලපත්‍ර 74 ක් අලුතින් නිකුත් කර ඇත. ඒ අනුව 2014 වර්ෂයේදී රබර් වෙළඳුන් 1107 ක් මෙම දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී ඇත. දිස්ත්‍රික්ක වශයෙන් එම වෙළඳ බලපත්‍ර නිකුත් කිරීම් මෙසේය.

| දිස්ත්‍රික්කය | අලුත් කළ බලපත්‍ර සංඛ්‍යාව | අලුතින් නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව |
|---|---|---|
| කොළඹ | 55 | 02 |
| ගම්පහ | 41 | 06 |
| කළුතර | 333 | 17 |
| රත්නපුර | 223 | 12 |
| කෑගල්ල | 228 | 23 |
| කුරුණෑගල | 17 | 01 |
| මහනුවර | 10 | 02 |
| මාතලේ | 04 | - |
| ගාල්ල | 68 | 06 |
| මාතර | 34 | 05 |
| හම්බන්තොට | 01 | - |
| මොණරාගල | 18 | - |
| බදුල්ල | 01 | - |
| එකතුව | **1033** | **74** |

**සංඛ්‍යා සටහන XV**

## 3.8. රබර් නැවත වගා / අළුත් වගා සහනාධාර ක්‍රමය

සහනාධාර ක්‍රමය යටතේ රබර් නැවත හෝ අළුතෙන් වගා කිරීම සඳහා 1953 අංක 36 දරණ රබර් නැවත වගා කිරීමේ පනතේ 07 වගන්තිය අනුව අවසර පත්‍රයක් ලබාගත යුතුය. මෙම පනත අනුව සියලුම රබර් ඉඩම් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි විය යුතුය. ලියාපදිංචි වූ රබර් ඉඩමක පවතින වගාවේ වයස අවු 20 ඉක්ම වූ පසු එම ඉඩම සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කිරීම සඳහා බලපත්‍රයක් ලැබීමට සුදුසුකම් ලබයි.

රබර් වගාවේ නිරත වන්නන් තව දුරටත් දිරි ගැන්වීම සඳහා හෙක්ටයාරයකට රු. 125,000 ක් වූ නැවත වගා/ අළුත් වගා සහනාධාර මුදල 2011 වසරේදී පහත පරිදි වැඩි කරන ලදී.

අළුත් වගාව සඳහා හෙක්ටයාරයකට රු. 150,000

නැවත වගාව සඳහා හෙක්ටයාරයකට රු. 175,000

මෙම ආධාර මුදල වාරික 08 කින් ගෙවනු ලැබේ. වාරික ගෙවන ආකාරය පහත සටහනේ දැක්වේ.

| වාරිකය | අලුත් වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්) | නැවත වගාව හෙක්ටයාරයකට (මුදල රුපියල් වලින්) |
|---|---|---|
| පළමු වාරිකය (1) | 6,000.00 | 8,000.00 |
| දෙවන වාරිකය (2) | 36,000.00 | 43,000.00 |
| තෙවන වාරිකය (3) | 12,000.00 | 15,000.00 |
| සිව්වන වාරිකය (4) | 18,000.00 | 21,000.00 |
| පස්වන වාරිකය (5) | 18,000.00 | 21,000.00 |
| හයවන වාරිකය (6) | 18,000.00 | 21,000.00 |
| හත්වන වාරිකය (7) | 19,000.00 | 22,000.00 |
| අටවන වාරිකය (8) | 23,000.00 | 24,000.00 |
| **එකතුව** | **150,000.00** | **175,000.00** |

**සංඛ්‍යා සටහන xvi**

## 3.9. "මහින්ද චින්තනය" ඉදිරි දැක්ම හා රජයේ මධ්‍යකාලීන ආර්ථික සැලැස්ම ක්‍රියාත්මක කිරීම හා නව වගාවද ඇතුලත්ව රබර් වගා කිරීමේ ප්‍රගතිය

මහින්ද චින්තන " වැවිල්ලට නවෝදයක් " වැඩසටහන යටතේ රබර් සංවර්ධනය උදෙසා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් කරන ලද කාර්යභාරය පහත සඳහන් පරිදි වේ. ඒ අනුව මෙරට රබර් කර්මාන්තය ශක්තිමත් ආර්ථික ව්‍යාපෘතියක් ලෙස පවත්වාගෙන යාම සඳහා වයස්ගත වූ, කල් ඉක්මවූ හා ආර්ථික වශයෙන් ඵලදායී නොවන රබර් වගාවන් ඉවත්කොට එම ඉඩම් නැවත වගා කළ යුතු වේ. ඵලදායී වගාවක් පවත්වාගෙන යාම සඳහා මුළු රබර් බිම් ප්‍රමාණයෙන් 3% ක් වත් වාර්ෂිකව නැවත වගා කළ යුතු වේ. එම බිම් ප්‍රමාණය දළ වශයෙන් හෙක්ටයාර් 4000 වේ. 2014 වර්ෂයේ ඇස්තමේන්තු ගත නැවත වගා/ අළුත් වගා රබර් බිම් ප්‍රමාණය හෙක්ටයාර් 11280 විය. 2014 වර්ෂයට නැවත වගා කිරීම සඳහා ඉලක්ක බිම් ප්‍රමාණය කුඩා වතු යටතේ හෙක්ටයාර් 2050 සහ වතු සමාගම් යටතේ හෙක්ටයාර් 1640 ක්ද වශයෙන් හෙක්ටයාර් 3690 කි. වර්ෂය තුල අළුත් වගා ඉලක්කය කුඩා වතු යටතේ සම්ප්‍රදායික ප්‍රදේශ වල හෙක්ටයාර් 1920 සහ සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වල හෙක්ටයාර් 5670 ක්ද වශයෙන් හෙක්ටයාර් 7590 කි.

නැවත වගා හා අළුත් වගා සහනාධාර ක්‍රමයන් යටතේ වගා කිරීම සඳහා ලැබුණු ඉල්ලුම් පත්‍ර, නිකුත්කල බලපත්‍ර හා නියම වශයෙන් වගා කරන ලද බිම් ප්‍රමාණයන් සංඛ්‍යා සටහන් xii හා xiii හි සඳහන් වේ.

## රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය

## (කුඩා වතු හිමියන්) 2014 වර්ෂය

*(හෙක්ටයාර්)*

| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | නැවත වගාකළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 925 | 658.24 | 919 | 655.19 | 565 | 386.34 |
| කෑගල්ල | 1312 | 786.92 | 1081 | 633.66 | 746 | 439.87 |
| ගම්පහ | 184 | 115.22 | 158 | 98.57 | 115 | 76.75 |
| කුරුණෑගල | 24 | 39.23 | 23 | 38.76 | 07 | 14.38 |
| මහනුවර | 46 | 38.77 | 43 | 32.71 | 33 | 19.44 |
| මාතලේ | 04 | 24.86 | 04 | 24.86 | 03 | 5.66 |
| රත්නපුර | 421 | 281.82 | 499 | 357.36 | 300 | 207.71 |
| ගාල්ල | 48 | 37.05 | 38 | 26.42 | 13 | 18.35 |
| මාතර | 44 | 37 | 40 | 30.99 | 21 | 16.04 |
| මොණරාගල | 06 | 8.47 | 05 | 7.67 | 05 | 7.67 |
| බදුල්ල | 03 | 13.35 | 3 | 13.35 | 3 | 13.35 |
| කොළඹ | 237 | 155.17 | 238 | 167.56 | 193 | 137.35 |
| **එකතුව** | **3254** | **2196.11** | **3051** | **2087.11** | **2004** | **1342.91** |

**සංඛ්‍යා සටහන xvii**

## රබර් අළුත් වගා සහනාධාර ක්‍රමය යටතේ වගා කළ බිම් ප්‍රමාණය
## (කුඩා වතු හිමියන්) 2014

*(හෙක්ටයාර්)*


| දිස්ත්‍රික්කය | ලද අයදුම් පත්‍ර | | නිකුත් කළ බලපත්‍ර | | අළුතින් වගා කළ බිම් ප්‍රමාණය | |
|---|---|---|---|---|---|---|
| | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) | බිම් කට්ටි ගණන | බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
| කළුතර | 337 | 204.31 | 334 | 159.73 | 200 | 98.91 |
| කෑගල්ල | 1006 | 447.26 | 864 | 343.28 | 579 | 250.55 |
| ගම්පහ | 162 | 87.68 | 123 | 61.7 | 91 | 49.76 |
| කුරුණෑගල | 149 | 106.44 | 121 | 83.39 | 79 | 56.51 |
| මහනුවර | 52 | 25.36 | 51 | 24.79 | 40 | 17.91 |
| මාතලේ | 14 | 26.18 | 13 | 18.85 | 03 | 6.47 |
| රත්නපුර | 346 | 214.76 | 372 | 243.15 | 271 | 153.41 |
| ගාල්ල | 137 | 77.69 | 127 | 69.73 | 45 | 18.07 |
| මාතර | 101 | 66.61 | 99 | 65.26 | 41 | 24.22 |
| හම්බන්තොට | 63 | 33.07 | 62 | 26.26 | 13 | 5.03 |
| කොළඹ | 119 | 63.88 | 110 | 60.02 | 81 | 48.63 |
| මොණරාගල | 728 | 490.52 | 719 | 479.52 | 378 | 235.93 |
| බදුල්ල | 220 | 192.78 | 131 | 128.46 | 78 | 83.87 |
| අම්පාර | 987 | 1044.35 | 651 | 497.45 | 346 | 256.17 |
| වවුනියාව | 03 | 19.02 | 03 | 19.02 | 01 | 12.14 |
| මුලතිවු | - | - | - | - | - | - |
| අනුරාධපුරය | 43 | 18.6 | 43 | 18.6 | 01 | 0.40 |
| පොළොන්නරුව | - | - | - | - | - | - |
| **එකතුව** | **4467** | **3118.51** | **3823** | **2299.21** | **2247** | **1317.98** |

**සංඛ්‍යා සටහන xviii**

**රබර් නැවත වගා සහනාධාර ක්‍රමය යටතේ නැවත වගා කළ බිම් ප්‍රමාණය (වතු අංශය) 2014**

| ප්‍රාදේශීය කාර්යාලය | වගා කල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---|
| රත්නපුර | 76.03 |
| කළුතර | 72.63 |
| කෑගල්ල | 537.77 |
| ගාල්ල | 20.96 |
| මොණරාගල | 46.00 |
| **එකතුව** | **753.39** |

**සංඛ්‍යා සටහන xix**



## රබර් නැවත වගා බිම් ප්‍රමාණය 1990-2014

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 3584 | 1617 | 5201 |
| 1991 | 3507 | 1794 | 5301 |
| 1992 | 2028 | 1889 | 3917 |
| 1993 | 2419 | 2817 | 5236 |
| 1994 | 1623 | 2138 | 3761 |
| 1995 | 1778 | 1461 | 3239 |
| 1996 | 1983 | 1217 | 3200 |
| 1997 | 1172 | 2045 | 3217 |
| 1998 | 1173 | 2542 | 3715 |
| 1999 | 665 | 3866 | 4531 |
| 2000 | 770 | 1853 | 2623 |
| 2001 | 558 | 4584 | 5142 |
| 2002 | 712 | 2066 | 2778 |
| 2003 | 565 | 494 | 1059 |
| 2004 | 819 | 1264 | 2083 |
| 2005 | 1257 | 2329 | 3586 |
| 2006 | 1122 | 2331 | 3453 |
| 2007 | 993 | 4199 | 5192 |
| 2008 | 812 | 5293 | 6105 |
| 2009 | 1002 | 5360 | 6362 |
| 2010 | 1186 | 4755 | 5941 |
| 2011 | 1123 | 1927 | 3050 |
| 2012 | 1117 | 1044 | 2161 |
| 2013 | 1710 | 1007 | 2717 |
| 2014 | 1343 | 753 | 2096 |

**සංඛ්‍යා සටහන XX**

# රබර් නව වගා බිම් ප්‍රමාණය 1990-2014

(හෙක්ටයාර්)

| වර්ෂය | කුඩා වතු අංශය | වැවිලි සමාගම් | එකතුව |
|---|---|---|---|
| 1990 | 1039 | 258 | 1297 |
| 1991 | 1602 | 202 | 1804 |
| 1992 | 612 | 302 | 914 |
| 1993 | 907 | 135 | 1042 |
| 1994 | 670 | 37 | 707 |
| 1995 | 651 | 45 | 696 |
| 1996 | 1208 | 35 | 1243 |
| 1997 | 793 | 21 | 814 |
| 1998 | 516 | 17 | 533 |
| 1999 | 223 | 48 | 271 |
| 2000 | 243 | 34 | 277 |
| 2001 | 150 | 14 | 164 |
| 2002 | 227 | 7 | 234 |
| 2003 | 451 | 7 | 458 |
| 2004 | 518 | 5 | 523 |
| 2005 | 1032 | 11 | 1043 |
| 2006 | 1603 | 297 | 1900 |
| 2007 | 1701 | 333 | 2034 |
| 2008 | 2755 | 414 | 3169 |
| 2009 | 1994 | 275 | 2269 |
| 2010 | 2857 | 96 | 2953 |
| 2011 | 2166 | 838 | 3004 |
| 2012 | 2297 | 179 | 2476 |
| 2013 | 2979 | - | 2979 |
| 2014 | 1428 | - | 1428 |

**සංඛ්‍යා සටහන xxi**

## 3.10. කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර් 5000 ක් වගා කිරීමේ විශේෂ වැඩසටහනේ වගා කටයුතු මෙම වර්ෂයේ ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව මොණරාගල දිස්ත්‍රික්කයේ බිබිල, බඩල්කුඹුර, මොණරාගල, මඩුල්ල සහ මැදගම යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. ඒ අනුව 2014 වසරේ හෙක්ටයාර් 110 වගා කරන ලදී.

එම හෙක්ටයාර් 5000 වගා කරන ලද ආකාරය පහත වගුවේ දැක්වේ.

| **වර්ෂය** | **වගා කරන ලද බිම් ප්‍රමාණය (හෙක්ටයාර්)** |
|---|---|
| 2008 | 625 |
| 2009 | 838 |
| 2010 | 1540 |
| 2011 | 709 |
| 2012 | 1113 |
| 2013 | 262 |
| 2014 | 110 |
| **එකතුව** | **5197** |

**සංඛ්‍යා සටහන xxii**

## 3.11. රබර් පැළ තවාන් සහ පැළ සැපයීම්

පසුගිය කාලයේ රබර් වගාව කෙරේ වැවිලි කරුවන්ගේ උනන්දුව අධික විය. මේ නිසා රබර් පැළ ඉල්ලුම නොකඩවා ඉහළ ගියේය. මේ සඳහා පැළ නිෂ්පාදනයට විශේෂ අවධානයක් දෙපාර්තමේන්තුව විසින් යොමු කෙරිණි. ඒ වෙනුවෙන් දෙපාර්තමේන්තුවේ රබර් පැළ තවාන් මෙන්ම පුද්ගලික රබර් පැළ තවාන් ආරම්භ කිරීම සිදු කෙරිණි.


පුද්ගලික රබර් පැළ තවාන් හා වාණිජ රබර් පැළ තවාන් පිහිටුවීම සඳහා දෙපාර්තමේන්තුවෙන් අවසර පත්‍රයක් ලබා ගත යුතුය. මූලික අවස්ථාවේදී මෙම තවාන් වල උසස් තත්වයේ බද්ධ අතු තවාන් පිහිටුවා ගැනීම සඳහා අවශ්‍ය රෝපණ ද්‍රව්‍ය දෙපාර්තමේන්තුව සතු තවාන් වලින් සපයනු ලබයි.

### 3.11.1. රජයේ පැළ තවාන්

**රජයේ තවාන් වල පැළ නිෂ්පාදනය හා පැළ නිකුත් කිරීම-2014**

| තවානේ නම | තවාන අයත් වන දිස්ත්‍රික්කය | පැළ නිෂ්පාදනය | පැළ බෙදාහැරීම |
|---|---|---|---|
| කරපිංච | රත්නපුර | 123,108 | 89,447 |
| මීරිගම | ගම්පහ | 322,521 | 230,548 |
| වැලිකඩමුල්ල | ගම්පහ | 478,446 | 367,273 |
| ඇගල්ඔය | කළුතර | 412,993 | 220,100 |
| කුඹුක්කන | මොණරාගල | 497,749 | 305,409 |
| ගුරුගොඩ | කළුතර | 315,449 | 90,059 |
| මිද්දෙණිය | හම්බන්තොට | 132,475 | 65,038 |
| **එකතුව** | | 2,282,741 | 1,367,874 |

**සංඛ්‍යා සටහන xxiii**




දෙපාර්තමේන්තු පැළ තවාන් වලින් 2014 වසරේදී අපේක්ෂිත පැළ නිෂ්පාදනය මිලියන 2.45 කි. වසරේ මුළු පැළ නිෂ්පාදනය මිලියන 2.28 වූ අතර වසර තුල බෙදා හැරීමට හැකි වූයේ පැළ මිලියන 1.37 ක් පමණි. මෙම දෙපාර්තමේන්තුව විසින් නව රබර් පැළ තවානක් අම්පාර දිස්ත්‍රික්කයේ පදියතලාවේ ස්ථාපනය කර ඇත. මේ වන විට එම තවාන් වල යටිතල පහසුකම් සංවර්ධනය කරමින් පවතී. එළඹෙන 2015 වසරේ සිට මෙම පැළ තවානෙහි බද්ධ රබර් පැළ නිෂ්පාදනය ආරම්භ කිරීමට අපේක්ෂිතය.

### 3.11.2. පුද්ගලික සහ වාණිජ තවාන් බලපත්‍ර 2014

උසස් තත්වයේ බද්ධ රබර් පැළ වැවිලිකරුවන්ට ලබාදීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ. දෙපාර්තමේන්තු තවාන්වල පැළ නිෂ්පාදන ධාරිතාවය වැඩිකිරීම පැළ වල ගුණාත්මක බව වැඩි දියුණු කිරීම හා තවාන් යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ අරමුණින් තවාන් සංවර්ධන කටයුතු රාශියක් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. පුද්ගලික අංශයේ තවාන් ද උසස් පැළ නිෂ්පාදනය සඳහා යොමු කිරීම දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයකි. නිර්දේශිත ආකාරයට පිහිටුවා ඇති පැළ තවාන් සඳහා අවසර පත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරයි. බලපත්‍ර නිකුත් කල පුද්ගලික පැළ තවාන් රබර් පර්යේෂණායතනයේ නිරන්තර අධීක්ෂණයට ලක් වන අතර පැළ තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ද ලබාදේ. මෙම පැළ තවාන් නිර්දේශිත ආකාරයට පවත්වාගෙන යන්නේ දැයි පසු විපරම් කිරීම රබර් සංවර්ධන නිලධාරීන් විසින් සිදු කරනු ලබයි.

**පැළ නිෂ්පාදනය ( පුද්ගලික පැළ තවාන්) 2014**

| ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශය | ලියාපදිංචි තවාන් ගණන | පැළ නිෂ්පාදනය | පැළ බෙදාහැරීම |
|---|---|---|---|
| කෑගල්ල | 51 | 1,345,248 | 604,579 |
| ගම්පහ | 08 | 106,800 | 38,306 |
| මාතලේ | 02 | 8,000 | - |
| මහනුවර | 01 | - | - |
| කළුතර | 30 | 507,636 | 294,280 |
| මොණරාගල | 05 | 362,500 | 121,000 |
| ගාල්ල | 07 | 60,560 | 4,800 |
| මාතර | 06 | 50,558 | 17,285 |
| රත්නපුර | 22 | 879,037 | 359,495 |
| කොළඹ | 08 | 98,700 | 7,150 |
| **එකතුව** | **140** | **3,419,039** | **1,446,895** |

**සංඛ්‍යා සටහන xxiv**

### 3.12. අතුරු බෝග වගාව

රබර් සමග අතුරු බෝග වගා කරන කුඩා ඉඩම් හිමියන් සඳහා රබර් පර්යේෂණ ආයතනයේ නිර්දේශ මත අක්කරයකට රු 4000.00 බැගින් සහනාධාර ගෙවීම මෙම දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. මේ අනුව 2014 වර්ෂයේ දී අතුරු බෝග සහනාධාර වශයෙන් රු.මි. 1.33 ක මුදලක් ගෙවන ලදී.




රබර් සමඟ කෙසෙල් වගා කළ ඉඩමක්

**2014 වර්ෂයේ අතුරු බෝග වගාකල බිම් ප්‍රමාණය**

| දිස්ත්‍රික්කය | වගාකල බිම් ප්‍රමාණය (හෙක්ටයාර්) |
|---|---:|
| කෑගල්ල | 77.49 |
| ගම්පහ | 47.49 |
| කුරුණෑගල | 13.78 |
| මහනුවර | 6.00 |
| කළුතර | 51.72 |
| රත්නපුර | 9.79 |
| කොළඹ | 61.57 |
| ගාල්ල | 2.21 |
| මාතර | 5.37 |
| හම්බන්තොට | 21.49 |
| මොනරාගල | 48.81 |
| බදුල්ල | 18.41 |
| **එකතුව** | **364.13** |

**සංඛ්‍යා සටහන XXV**




### 3.13. වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීම

පරිනත රබර් වගා ඉඩම් වල ඵලදායීතාවය ඉහළ නැංවීම සඳහා රබර් වගාකරුවන් වැහි ආවරණ භාවිතයට උනන්දු කිරීම උදෙසා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. සාර්ථක වැහි ආවරණ යොදා ඇති ගසකට ඒ සඳහා වැයවන මුදලින් 50% එනම් රු. 30 ක මුදලක් සහනාධාර වශයෙන් ගෙවනු ලබයි.

කුඩා වතු හා වැවිලි සමාගම් සඳහා මේ යටතේ සහනාධාර ගෙවීම් කරන ලදි. මෙම වැඩසටහනේ ප්‍රගතිය පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**වැහි ආවරණ යෙදීම**

| අංශය | වැහි ආවරණ යෙදූ බිම් ප්‍රමාණය (හෙක්.) | සහනාධාර වශයෙන් ගෙවූ මුදල රු. මි. |
|---|---:|---:|
| කුඩා වතු | 308.88 | 4.29 |
| වැවිලි සමාගම් | 4060.47 | 22.48 |
| එකතුව | **4369.35** | **26.77** |

**සංඛ්‍යා සටහන xxvi**

### 3.13.1. වැහි ආවරණ යෙදීම දිස්ත්‍රික්ක වශයෙන්

| දිස්ත්‍රික්කය | වැව්ලි සමාගම් (හෙක්.) | කුඩා වතු (හෙක්.) |
|---|---:|---:|
| රත්නපුර | 65.34 | 63.85 |
| කොළඹ | 103.60 | 65.51 |
| කෑගල්ල | 2974.80 | 65.59 |
| ගම්පහ | 29.95 | 11.92 |
| කුරුණෑගල | 545.95 | - |
| මහනුවර | - | 4.65 |
| ගාල්ල | 14.23 | 14.79 |
| මාතර | 5.58 | 37.8 |
| හම්බන්තොට | - | 1.08 |
| කළුතර | 321.03 | 43.69 |
| **එකතුව** | **4060.48** | **308.88** |

**සංඛ්‍යා සටහන xxvii**

## 3.14. තේ, රබර් සහ පොල් ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයේ කටයුතු

1958 අංක 02 දරණ තේ හා රබර් වතු (කැබලි කිරීම පාලනය කිරීමේ) පණත යටතේ ඉඩම් කැබලි කිරීම පාලනය කිරීමේ මණ්ඩලයක් පිහිටුවනු ලැබ ඇත. හෙක්ටයාර 20 ට වැඩි රබර් වත්තක් හෝ ඉන් කොටසක් කැබලි කැඩීමට හෝ විකිණීමට අවශ්‍ය වූ විට එම මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු වේ. මෙහිදී එම ආයතනයෙන් ලැබුණු අයදුම්පත්‍ර සඳහා මැනවින් සුපරීක්ෂණය කර ඉහත කී මණ්ඩලය වෙත නිර්දේශ සඳහා යවනු ලබයි. වර්ෂය තුල යවන ලද නිර්දේශ ගණන පහකි.

මෙම මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස ගරු අමාත්‍යවරයා විසින් කරන ලද පත්වීම ප්‍රකාර රාජකාරි ඉටු කරන ලදී.

## 3.15. අන්තර් ජාතික කටයුතු

ශ්‍රී ලංකාව **ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමේ (IRSG)** හා **ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC)** සාමාජිකත්වය දරයි. ඒ සඳහා 2014 වර්ෂයේ සාමාජික මුදල වශයෙන් ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයට **රු. 1,010,870** ක් ද ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායමට **රු. 5,485,595.61** ක් ද ගෙවා ඇත.

මෙම ආයතනවල සාමාජිකත්වය දැරීමෙන් එකී ආයතනවල ක්‍රියාකාරකම් වලට සෘජුව හා ක්‍රියාශීලීව දායක වීම තුලින් අන්‍යොන්‍ය වශයෙන් රබර් කර්මාන්තයේ උන්නතියට වාසි සහගතතාවයක් උදා කෙරිණි. තවද එකී ආයතනවලට දේශීය රබර් මිල, නිෂ්පාදන හා අලෙවි තොරතුරු, වගා බිම් ප්‍රමාණ, ක්ෂේත්‍රයේ නියැලි සංඛ්‍යාවන් ඇතුළු අවශ්‍ය සියළු තොරතුරු කලට වේලාවට වර්ෂය පුරාම වාර්තා කරන ලදී. එසේම එම ආයතන මගින් සෙසු රටවල තොරතුරුද ලබා ගෙන අදාල පාර්ශවයන් අතර බෙදාහරින ලදී.

පසුගිය වසරේ ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ (ANRPC) වාර්ෂික සමුළුව මැලේසියාවේදී පැවැත්විණි. ඒ සඳහා ශ්‍රී ලංකාව, ඉන්දියාව, කාම්බෝජය, තායිලන්තය, වියට්නාමය, ඉන්දුනීසියාව, මලයාසියාව, චීනය යන සාමාජික රටවල් සහභාගි විය.

මෙම සමුළුවේදී ඉදිරි වසර සඳහා සභාපතිත්වය මැලේසියාවට හිමි විය.

## 3.16. නෛතික කටයුතු

රබර් නැවත වගා කිරීම පිණිස සහනාධාර පනත යටතේ රබර් වගා අවසර පත්‍රයක් මත ආධාර ලබාගත් සෑම ඉල්ලුම්කරුවෙක්ම සියළුම ආධාර මුදල් ලබාගෙන නිම කරන තුරු වගාව හොඳින් පවත්වා ගෙන යෑමට සහ අවශ්‍ය වැඩ කටයුතු කිරීමට සහනාධාර නියෝග අනුව බැඳී සිටී. අවසර පත්‍ර දරන්නන් ඔවුන්ගේ වගාව නොසලකා හරින්නේ නම් සහ අවසන් ආධාර වාරිකය ලබාගන්නා තෙක් වගාව හොඳින් පවත්වාගන නොයන්නේ නම් ලබාගෙන ඇති ආධාර මුදල් දෙපාර්තමේන්තුවට ආපසු ගෙවීමට නියෝග කරනු ලැබේ.

ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ අදාල පනත අනුව ගැසට් පත්‍රයේ පල කරන ලද නියෝගවල විධි විධාන පරිදි ආධාර ලබන ඉඩමක් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අවසර රහිතව අන්සතු කළ නොහැක.

මේ අනුව අවසර පත්‍රයේ වලංගු කාල සීමාව දීර්ඝ කර අවසර පත්‍ර දරන්නන්ට වගාව සම්පූර්ණ කිරීමට තරම් අවශ්‍ය කල් ලබාදී රබර් නැවත වගා සහනාධාර පනතේ පරමාර්ථ ඉටු නොවන අයුරින්, සාර්ථකව රබර් වගාවක් පවත්වාගන යාමට අපොහොසත් වන (සහනාධාර ලබාගත්) ඉඩම් හිමියන්ට, ලබාගත් ආධාර ආපසු ගෙවීමට දන්වනු ලැබේ. එසේ නොගෙවන ඉඩම් හිමියන්ට අවසන් පියවරක් වශයෙන් නඩු පවරනු ලැබේ.

අසාර්ථක වගා අය කිරීම් - 2014 වර්ෂය

| දිස්ත්‍රික්කය | අයකරගත් වගාකරුවන් සංඛ්‍යාව | අවසන් නිවේදන යවා අය කර ගත් මුදල (රු.) | නඩු පවරා අය කර ගත් මුදල (රු.) |
|---|---|---|---|
| ගාල්ල | 20 | 44,702.18 | |
| මාතර | 34 | 70,688.90 | - |
| හම්බන්තොට | 02 | 9500.00 | |
| කෑගල්ල | 141 | 704,335.34 | 719,780.14 |
| මොණරාගල | - | - | - |
| කොළඹ | 7 | 45,339.50 | - |
| රත්නපුර | 18 | 133,888.36 | - |
| කළුතර | 111 | 753,750.46 | - |
| **එකතුව** | **333** | **1,762,204.74** | **719,780.14** |

**සංඛ්‍යා සටහන xxviii**

තවද දේශගුණික හා වෙනත් සාධාරණ හේතු මත වගාවන් අසාර්ථක වූ ගොවීන් සම්බන්ධයෙන් පනතේ ප්‍රතිපාදන ක්‍රියාත්මක කරමින් නැවත වගා උපදේශක මණ්ඩලයේ අනුමැතිය ලබා සහනාධාර මුදල් කපා හැරීමට කටයුතු කරනු ලැබේ.

## 3.17. සහනාධාර ගෙවීම්

සමාලෝචනයට භාජනය වන 2014 වසර තුල පහත දැක්වෙන පරිදි ඒ ඒ වගාවන් සඳහා සහනාධාර මුදල් ගෙවීමට දෙපාර්තමේන්තුව සමත් විය.

**රබර් වගාව සඳහා සහනාධාර ගෙවීම්**

| ව්‍යාපෘතිය | ගෙවූ මුදල් එකතුව ( රු.මි. ) |
|---|---|
| 2014 නැවත වගා සහනාධාර (පෞද්ගලික අංශය) | 219.07 |
| 2014 අළුත් වගා සහනාධාර(පෞද්ගලික) | 213.47 |
| 2014 නැවත වගා සහනාධාර (වැවිලි සමාගම්) | 134.73 |
| **එකතුව** | **567.27** |

**සංඛ්‍යාන සටහන xxix**

## 3.18. විශේෂ සංවර්ධන වැඩසටහන්

### 3.18.1. අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම

2012 අයවැය යෝජනා අනුව අම්පාර දිස්ත්‍රික්කයේ රබර් වගාව ව්‍යාප්ත කිරීමට ගත් තීරණය අනුව හෙක්ටයාර 10,000 ප්‍රමාණයක රබර් වගා කිරීමට ඉලක්ක කොට ඇත. මෙහි මූලික පියවර වශයෙන් 2012 වසරේදී හෙක් 550 ක රබර් වගා ඉලක්කයක් පැවති අතර වසර අවසාන වන විටදී හෙක් 137.5 ක රබර් වගා කරන ලදී. මහඔය, පදියතලාව, උහන යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 3 ටම බෙදී යන ආකාරයට රබර් වගා වැඩසටහන ව්‍යාප්ත වී පවතී.

එහි දෙවන පියවර වශයෙන් 2013 වසරේදී හෙක් 402.93 වගා කරන ලදී. එහි තුන් වන පියවර වශයෙන් 2014 වර්ෂයේදී හෙක්. 256.17 ක් වගා කරන ලදි. ඒ අනුව මේ දක්වා හෙක්ටයාර 796.60 ක් වගාකර ඇත.

### 3.18.2 උතුරු පළාතේ රබර් වගාව ව්‍යාප්ත කිරීම

උතුරු පළාතේ රබර් වගාව ව්‍යාප්ත කිරීමේ වැඩසටහන යටතේ හෙක්ටයාර් 3200 ක රබර් වගා වැඩසටහනක් වවුනියාව හා මුලතිවු දිස්ත්‍රික්ක වල ව්‍යාප්ත කිරීම සඳහා පියවර ගෙන ඇත. ඒ අනුව එම පළාතේ ජනතාවට සාර්ථක සේවයක් සැලසීම සඳහා වවුනියාව දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ මෙම දෙපාර්තමේන්තුවේ කාර්යාලයක් ගරු වැවිලි කර්මාන්ත ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන් ආරම්භ කරන ලදි.

මේ වන විට වවුනියාව දිස්ත්‍රික්කයේ හෙක් **19.02** සඳහා බලපත්‍ර නිකුත් කර ඇති අතර හෙක් **12.14** ක රබර් අළුතින් වගා කර ඇත.

### 3.18.3. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන 2014

අඩු ආදායම්ලාභී පවුල් වල ජීවනෝපාය සංවර්ධනය කරගනිමින්, ග්‍රාමීය ආර්ථිකය ශක්තිමත් කිරීමට අවශ්‍ය මූලික යටිතල පහසුකම් පුළුල් කිරීමත්, ඔවුන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය ආදී සමාජ සංවර්ධනයට අවශ්‍ය පරිසරය සකස් කිරීමත්, ග්‍රාමීය ජනතාවගේ වෙළඳපොල අවශ්‍යතා හා ජාතික ආර්ථික ප්‍රතිලාභ උපරිම ලෙස ලබා ගැනීමට හැකිවන පරිදි යටිතල පහසුකම් සම්බන්ධ කිරීමත්, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ කාර්යභාරය වී ඇත.

ඒ අනුව, ආර්ථික සංවර්ධන අමාත්‍යංශයේ මූල්‍ය අනුග්‍රහය ඇතිව ක්‍රියාත්මක කරන දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන රබර් අංශය තුලද 2014 වර්ෂයේදීද ක්‍රියාවට නංවන ලදී. මේ යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් පාළු සිටුවීම සඳහා රබර් පැළ නොමිලේ සැපයීම, අපරිනත රබර් වගා බිම් වල අතුරු බෝග ලෙස කෙසෙල්, අන්නාසි වගා කිරීම සඳහා නොමිලේ පැළ සැපයීම, අස්වනු සහායක පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වූවන් හට 50% සහනාධාර මත කිරි පිහි ලබාදීම හා දෙපාර්තමේන්තුව සතු රබර් පැළ තවාන්වල කටයුතු වැඩිදියුණු කිරීම සඳහා ආධාර සැපයීම යන වැඩසටහන් මෙම වසරේදී ද ක්‍රියාත්මක කරන ලදී.

පාළු සිටුවීම සඳහා රබර් පැළ බෙදා දීම මෙම වර්ෂයේදී සම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන මොණරාගල, අම්පාර, හම්බන්තොට, වව්නියාව, බදුල්ල යන දිස්ත්‍රික්කයන් ඇතුළුව රබර් වගා කරන සියලුම දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක කල අතර අතුරු බෝග වගා වැඩසටහන සහ කිරි පිහි බෙදා දීමේ වැඩසටහන රබර් වගා කරන සියළුම ප්‍රදේශ ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරන ලදී. දෙපාර්තමේන්තුව සතු රබර් පැළ නිෂ්පාදනය කරන තවාන් 7 ක් දිස්ත්‍රික්ක 5 ක පවතින අතර ඒවායෙහි සංවර්ධන කටයුතු සඳහා මෙම වර්ෂයේදී ද ආධාර මුදල් ලබා දෙන ලදී. මෙය දිවිනැගුම වැඩසටහන යටතේ දෙවන වතාවට මෙම වසරේදී සිදු කරන ලදී. දැනට මෙහි ප්‍රතිඵලයක් ලෙස උසස් තත්ත්වයෙන් යුත් රබර් පැළ නිෂ්පාදනය කර බෙදාහැරීමට අවශ්‍ය කටයුතු සලසා ගැනීමට හැකි වීම මෙම වැඩසටහනෙන් ලද පිටුවහලකි. දිවි නැගුම වැඩසටහන යටතේ මෙම වර්ෂයේදී රුපියල් මිලියන 12.53 ක මුදලක් මෙම දෙපාර්තමේන්තුවට වෙන්කර දී තිබූ අතර එහි ප්‍රගතිය පහත වගුවේ දැක්වේ.

## දිවිනැගුම වැඩසටහනේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය

| වැඩසටහන | මූල්‍ය ප්‍රගතිය | | | භෞතික ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|---|
| | වෙන් කල මුදල රු.මි. | වියදම රු.මි. | % | භෞතික ඉලක්කය | භෞතික ප්‍රගතිය | % |
| පාළු සිටුවීම සඳහා රබර් පැළ සැපයීම (පැළ) | 6.00 | 7.86 | 131 | 100,000 | 130,955 | 131 |
| අතුරු බෝග වගාව (පැළ) | 2.1 | 1.73 | 82 | 46,200 | 63,438 | 137 |
| කිරි පිහි සැපයීම (පිහි ගණන) | 0.93 | 0.87 | 93 | 3,230 | 3,027 | 94 |
| රජයේ තවාන් සංවර්ධන කටයුතු කිරීම | 3.50 | 2.07 | 59 | 7 | | |
| 2014 එකතුව | 12.53 | 12.53 | 100 | - | - | - |

**සංඛ්‍යාන සටහන XXX**

## 3.19. ඒකාබද්ධ අරමුදල

| වියදම් විෂය | මුළු ප්‍රතිපාදන ලැබීම් රු. මි. | ශුද්ධ වියදම් රු. මි. |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | | |
| පුද්ගල පඩි නඩි | 178.10 | 170.01 |
| ගමන් වියදම් | 10.00 | 9.79 |
| සැපයීම් | 4.90 | 4.25 |
| නඩත්තු වියදම් | 6.04 | 5.91 |
| සේවා | 17.51 | 17.21 |
| ඉන්ධන | 4.65 | 4.35 |
| මාරු කිරීම් (සම්මාදම් දායක මුදල්, දේපළ ණය පොළී) | 8.10 | 7.99 |
| **එකතුව** | **229.3** | **219.51** |
| **ප්‍රාග්ධන වියදම්** | | |
| මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම් | 31.70 | 27.02 |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 2.80 | 2.12 |
| සංවර්ධන සහනාධාර | 787.00 | 786.36 |
| හැකියා වර්ධනය | 1.00 | 0.50 |
| වෙනත් මූලධන ආයෝජන (2502) | 47.00 | 36.06 |
| **එකතුව** | **869** | **852.06** |
| **මුළු එකතුව** | **1098.80** | **1071.57** |

**සංඛ්‍යා සටහන xxxi**

## 3.20. සෙස් බදු පිළිබඳ කටයුතු

(1) ලියාපදිංචිය

| | |
|---|---|
| ලියාපදිංචි ආයතන ගණන | 144 |
| ගෙවිය යුතු මුළු සමාගම් ගණන | 57 |
| සෙස් ගෙවන සමාගම් ගණන | 55 |

**දේශීය පරිභෝජනය අනුව අය කළ සෙස් බද්ද**

| **අදාල මාසය** | **ආදායම (දේශීය පරිභෝජනය අනුව)** රු. මිලි. |
|---|---|
| ජනවාරි | 31.90 |
| පෙබරවාරි | 18.70 |
| මාර්තු | 16.80 |
| අප්‍රේල් | 16.10 |
| මැයි | 10.20 |
| ජුනි | 23.50 |
| ජුලි | 13.60 |
| අගෝස්තු | 23.50 |
| සැප්තැම්බර් | 18.63 |
| ඔක්තෝම්බර් | 13.10 |
| නොවැම්බර් | 14.74 |
| දෙසැම්බර් | 28.86 |
| **එකතුව** | **229.63** |

**සෙස් බදු සංඛ්‍යා සටහන -xxxii**

රබර් ආනයනය හා අපනයනය මත අය කරන ලද සෙස් බදු මුදල් පිළිබඳ විස්තර මෙසේය.

**ආනයන හා අපනයන මත අය කළ සෙස් බද්ද - 2014**

| අදාල මාසය | ආනයනය මත රු.මිලි. | අපනයනය මත රු.මිලි. |
|---|---:|---:|
| ජනවාරි | 118.20 | 50.90 |
| පෙබරවාරි | 105.80 | 36.80 |
| මාර්තු | 134.20 | 31.00 |
| අප්‍රේල් | 122.00 | 26.10 |
| මැයි | 144.40 | 19.00 |
| ජුනි | 119.70 | 20.90 |
| ජුලි | 127.80 | 17.60 |
| අගෝස්තු | 137.10 | 19.90 |
| සැප්තැම්බර් | 162.60 | 17.50 |
| ඔක්තෝම්බර් | 185.60 | 18.30 |
| නොවැම්බර් | 159.90 | 15.10 |
| දෙසැම්බර් | 180.70 | 20.70 |
| **එකතුව** | **1,698.00** | **293.80** |

**සෙස් බදු සංඛ්‍යා සටහන xxxiii**

## 3.21. නැවත වගා කිරීමේ උපදේශක මණ්ඩලය

1953 අංක 36 දරණ රබර් නැවත වගා සහනාධාර පනතේ 10 වන වගන්තිය සහ 1956 අංක 11 දරණ රබර් පාලන පනතේ 40 හා 41 යන වගන්ති වලට අනුකූලව මෙම මණ්ඩලය ස්ථාපනය කොට ඇත.

මෙම මණ්ඩලය රබර් නැවත වගා සහනාධාර පනත සම්බන්ධව පැන නැගෙන කරුණු පිළිබද ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමන්ට උපදෙස් ලබාදීම සහ රබර් නැවත වගා කිරීමේ සහනාධාර ක්‍රමය පරිපාලනය කිරිම සඳහා අධ්‍යක්ෂ ජනරාල් වරයාට උපදෙස් ලබාදීම සිදු කරනු ලබයි.

මෙහි සභාපති නිල බලයෙන් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වේ. ඉතිරි සාමාජිකයින් ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පත් කරනු ලබයි.

## 3.22. අභ්‍යන්තර විගණන කටයුතු

- අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කළුතර ප්‍රාදේශීය කාර්යාලය
- ගබඩා භාණ්ඩ පරීක්ෂාව - කොළඹ ප්‍රධාන කාර්යාලය
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- මොණරාගල රබර් සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂගේ අක්‍රමිකතා සම්බන්ධයෙන් වූ මූලික විමර්ෂණ සිදු කිරීම.
- අභ්‍යන්තර විගණන පරීක්ෂණය - කරපිංච රබර් පැළ තවාන
- දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සිදු කරනු ලබන නව ඉදිකිරීම් හා අලුත්වැඩියාවන් වලට අදාල භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ගත නොකිරීම.
- ප්‍රධාන කාර්යාලයේ ප්‍රචාරක අංශය සඳහා මිලදී ගනු ලැබූ භාණ්ඩ විධිමත්ව ඉන්වෙන්ට්‍රිගත නොකිරීම.
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- නිවාඩු හා පැමිණීම පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- ප්‍රධාන කාර්යාලයේ සහ ප්‍රාදේශීය කාර්යාල වල බැංකු සැසඳුම් පරීක්ෂා කිරීම
- 2014 වර්ෂයේ ඇස්තමේන්තු පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- මිලදී ගැනීම් හා ගබඩා ලේඛන පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- ගෙවීම් වවුචර් පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය
- වාහන වල දෛනික ධාවන සටහන් පරීක්ෂා කිරීම - කොළඹ ප්‍රධාන කාර්යාලය

### 3.23. ප්‍රචාරක අංශය මගින් ඉටු කරන ලද කාර්යන්.

- දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය වෙනුවෙන් ප්‍රදර්ශන කුටියක් කුලියාපිටිය තාක්ෂණ විද්‍යාලයේදී දින 7 ක් පවත්වාගෙන යාම.
- ජාතික ගොවි සතිය වෙනුවෙන් මාතර තෙලිජ්ජවිල කෘෂිකර්ම විද්‍යාලයේදී ප්‍රදර්ශන කුටියක් දින 10 ක් පවත්වාගෙන යාම.
- සබරගමුව පළාත් සභාව විසින් සංවිධානය කරන ලද තරුණෝදය ප්‍රදර්ශණයෙහි දින දෙකක ප්‍රදර්ශනයක් පවත්වාගෙන යාම.
- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිළධාරීන් සඳහා එක්දින වැඩමුළුවක් රබර් පර්යේෂණ ආයතනයේ අගලවත්ත කාර්යාලයේදි පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
- වැසි ආවරණ යෙදීම පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම සඳහා ප්‍රචාරාත්මක වැඩසටහන් පැවැත්වීම.
- වෘත්තීය මට්ටමේ කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන් 11 ක් පැවැත්වීමට කටයුතු කිරීම සහ එහි ආරම්භක හා අවසන් දින සහභාගි වී අවශ්‍ය සහයෝගය ලබා දීම.
- සාමාන්‍ය කිරිකැපුම් ශිල්පී පුහුණු වැඩසටහන් 145 ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
- බද්ධ කරුවන් පුහුණු වැඩසටහන් 7 ක් පැවැත්වීමට කටයුතු සංවිධානය කිරීම.
- රබර් සංවර්ධන නිලධාරීන් සඳහා සේවා සංස්කරණ පාඨමාලාවක් පැවැත්වීම.
- ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව සමග රබර් වගාවේ සංවර්ධනය විදහා දැක්වීම සඳහා වීඩියෝ චිත්‍ර පටයක් නිෂ්පාදනය කිරීමට සහයෝගය ලබා දීම.
- කෘෂි කර්ම දෙපාර්තමේන්තුවේ ගුවන් විදුලි ගොවි සේවාව සමග රබර් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා උපදේශාත්මක වැඩසටහන් සඳහා සෑම සතියකම සහභාගී වීම.
- ප්‍රදර්ශන පුවරු 30 ක් ත්‍රෛයි භාෂාවෙන් සකස් කිරීම.

### 3.24. පරිගණක අංශය මගින් ඉටු කරන ලද කාර්යන්.

- රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රබර් වගා සහනාධාර ගෙවීම, පැළ තවාන් පිළිබඳ තොරතුරු හා වෙළඳ බලපත්‍ර වලට අදාල තොරතුරු කළමණාකරණය සඳහා සුදුසු වැඩි දියුණු කරන ලද පරිගණක මෘදුකාංගයක් සැකසීමේ ව්‍යාපෘතිය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ උපදේශකත්වය යටතේ ආරම්භ කරන ලදි. එම ව්‍යාපෘතිය අදියර දෙකකින් සමන්විත වන අතර, පළමු අදියර වන පද්ධති අධ්‍යයනය තෝරා ගත් උපදේශක වරයෙකු මගින් සිදු කල අතර එය මේ වන විට අවසන් කර ඇත. මෙහි දෙවන අදියර යටතේ මෘදුකාංග සංවර්ධනය කිරීමේ කටයුතු 2015 වසරේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

- ප්‍රාදේශීය කාර්යාල වල ක්‍රියාත්මක වන සහනාධාර ගෙවීමේ පරිගණක වැඩසටහන් වල ගැටළු විසඳමින්, නිළධාරීන් සඳහා අවශ්‍ය පුහුණුව ලබා දීම.


- දෙපාර්තමේන්තු රබර් මිල කෙටි පණිවිඩ (SMS) මගින් ලබා දීමේ ව්‍යාපෘතිය ICTA ආයතනයේ උපදෙස් අනුව ක්‍රියාත්මක කිරිම.

- දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ රබර් මිල යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාම හා ඉදිරියේදි නවීකරණය කරන ලද වෙබ් අඩවියක් නිර්මාණය කිරිමේ කටයුතු සඳහා ICTA ආයතනය සමග සම්බන්ධීකරණ කටයුතු සිදු කිරිම.

## 4. ප්‍රාදේශීය කාර්යාල ප්‍රගතිය


දිවයිනේ රබර් වගා කරන දිස්ත්‍රික්ක 14 ක සේවා සැපයීම සඳහා ප්‍රාදේශීය කාර්යාල 5 ක් පිහිටුවා ඇති අතර 2014 වසරේදී එම කාර්යාල අත් කරගත් ප්‍රගතිය පහත පරිදි වේ.

### 4.1. රබර් නව වගා කුඩාවතු ප්‍රගතිය





අම්පාර දිස්ත්‍රික්කයේ වගා ඉලක්කය හෙක්. 3000 ක් විය. වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ මහවැලි ඉඩම් නිරවුල් කර ගැනීමට නොහැකි වූ නිසා ලබා දුන් ඉලක්ක කරා ලගා වීමට නොහැකි විය.


### 4.2. රබර් නැවත වගා ප්‍රගතිය




## 4.3. අතුරු බෝග වගා ප්‍රගතිය





## 4.4. වැහි ආවරණ යෙදීම (කුඩාවතු)




4.5. කිරි කැපුම් ශිල්පී පුහුණු වැඩසටහන




4.6. කිරි කැපුම් ශිල්පී වෘත්තීය පුහුණු වැඩසටහන



## 4.7. බද්ධකරුවන් පුහුණු වැඩසටහන








ප්‍රාදේශීය කාර්යාල මගින් පුහුණු වැඩසටහන් පැවැත්වීම

## 5. අනෙකුත් ආයතනවල සේවාවන් ඉටුකිරීම

ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් කරන ලද පත්කිරීම් ප්‍රකාර වර්ෂය තුල පහත සඳහන් ආයතන වල අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකත්වය දරමින් පැවරුන රාජකාරි ඉටු කරන ලදී.

1) ලංකා රබර් පර්යේෂණ මණ්ඩලය

2) තුරුසවිය අරමුදල

3) ශ්‍රී ලංකා රබර් නිෂ්පාදන හා අපනයන සංස්ථාව

4) වතු ඉඩම් කැබලි කිරීම පාලනය කිරිමේ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර වලට සහභාගි වීම, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම, තීරණ සඳහා සහාය දීම, අවශ්‍ය එකඟතා සහ අනුමැතීන් පළ කිරීම, කටයුතු විමර්ශනය කිරීම, එකී ආයතනවල ක්‍රියාත්මක වැඩ සටහන් සඳහා දායකත්වය සැපයීම යන කටයුතු මෙහිදී ඉටු කරන ලදී.

මීට අතිරේකව දෙපාර්තමේන්තුවේ සේවාවන් අවශ්‍ය කළ සියලුම අමාත්‍යංශ දෙපාර්මේන්තු, අනකුත් රාජ්‍ය ආයතන, පෞද්ගලික ආයතන පුද්ගලයන්ට ඔවුන් ඉල්ලා සිටි සේවාවන් තොරතුරු හා සහායන් නොඅඩුව ලබාදුණි. පාසැල් ප්‍රදර්ශන සහාය දේශන හා තොරතුරු සහාය. ආයතනවලට හා පුද්ගලයන්ට අවශ්‍ය සංඛ්‍යාත්මක තොරතුරු හා පැහැදිලි කිරීම්, ශිල්පීය උපදෙස් ආදිය ලබාදීම මේ අතර විය.

මේ සේවාවන් හා තොරතුරු ලබාදීම ප්‍රධාන කාර්යාලයේ ප්‍රදේශීය කාර්යාලවල හා ක්ෂේත්‍ර නිලධාරීන්ගේද තවාන් කළමණාකරුවන්ගේද සහයෙන් සිදුවිය.

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. LP/J/RCF/FA/2014/01 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2015 ජුනි 19 දින

අධ්‍යක්ෂ ජනරාල්

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

**රබර් පාලන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව.**

---

රබර් පාලන අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය වැදගත් හා ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1957 අංක 45 දරන රබර් පාලන (සංශෝධිත) පනතින් සංශෝධිත 1956 අංක 11 දරන රබර් පාලන පනතේ (436 අධිකාරය) 39 (අ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු.1,864,559 ක් රබර් පාලන අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම<br>රු. | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් | 985,925 | මෙම වත්කම් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා වර්ෂ 17කට පෙර ලබාදී ඇති බව විගණනයට දන්වා ඇතත් එම වත්කම් ලේඛනයක් හෝ භෞතිකව පවතින බවට සාක්ෂියක් ඉදිරිපත් නොකෙරිණි. |
| (ආ) | ජංගම වත්කම් | 635,272 | (i). විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ රු. 287,378 ක් වූ අත්තිකාරම් වර්ෂ 17කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන අතර එය අයවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.<br>(ii). එකම කළමනාකරණයක් යටතේ පැවති රබර් නැවත වගා අරමුදලින් ලැබිය යුතු රු. 210,010 ක් අයකර ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. |

(iii). විවිධ ආයතනවලින් ලැබිය යුතු රු.137,884 ක්වූ ශේෂ සත්‍ය වශයෙන්ම ලැබිය යුතුව පවතින බව තහවුරු කර ගැනීමට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ඇ) ජංගම බැරකම් 239,784

(i). බැදීම ඇතිවීමට හේතු අනාවරණය නොකළ රු.222,031 ක් වූ ගෙවිය යුතු අත්තිකාරම් වර්ෂ 17 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන අතර එය ගෙවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(ii). වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණු රු.5,448 ක පොදු තැන්පතුවලට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(iii). තැපැල් දෙපාර්තමේන්තුව සමඟ තොරතුරු හුවමාරු කරගැනීම මගින් පහසුවෙන් නිරවුල් කර ගත හැකිව තිබුණු උපචිත මුද්දර හා විදුලි සංදේශ ගාස්තු රු.10,689 ක් වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණි.

(iv). ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වර්ෂ 17 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන උපචිත වියදම් රු.1616 ක් පොත්වලින් ඉවත්කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් ස්ථාවර තැන්පතු හා ඉතිරි කිරීමේ තැන්පතු සඳහා පොළී ආදායමක් ලබා තිබුණු අතර එය අරමුදලේ එකම ආදායම් ප්‍රභවය වී තිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට රු.10,961,943 ක්වූ අදාල ස්ථාවර තැන්පතු 02 සහ රු.3,599,113 ක්වූ ඉතිරි කිරීමේ තැන්පතුව ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු බැවින් තවදුරටත් අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරිත්වයක් නොපැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

## 3.2 මෙහෙයුම් සමාලෝචනය

### 3.2.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

දැනට ක්‍රියාකාරිත්වයේ නොපවතින රබර් පාලන අරමුදල මාස 06 ක කාලයක් තුළ ඈවර කිරීමේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 ජූලි 04 දිනැති අංක RDD/02/10/ඈවර(නැ.ව) ලිපිය මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට දන්වා තිබුණු අතර 2014 දෙසැම්බර් 01 දින ශේෂ නිරවුල් කිරීමේ කමිටුවක් ද පත් කර තිබුණි.එම කමිටුවේ නිර්දේශ මත අරමුදලට අයත්ව තිබුණු ඉතිරි කිරීමේ තැන්පතු හා ස්ථාවර තැන්පතු ගිණුම්වල ශේෂ ඒකාබද්ධ අරමුදලට මාරු කිරීම පමණක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු අතර ඉතිරි වත්කම් හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

මගේ අංකය / எனது இல. / My No. } LP/J/RRSF/FA/2014/01 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2015 ජූලි 15 දින

අධ්‍යක්ෂ ජනරාල්
රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

---

රබර් නැවත වගා සහනාධාර අරමුදලේ 2014 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1953 අංක 36 දරන රබර් නැවත වගා සහනාධාර අරමුදල් පනතේ (437 අධිකාරිය) 6 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැළපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය ව්‍යාවනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ අරමුදලට බැරකර තිබූ රු. 70,659,527 ක් රබර් නැවත වගා සහනාධාර අරමුදලෙන් අඩුකර දක්වනවා වෙනුවට එය ජංගම වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ආ) 2010 වර්ෂය දක්වා විගණන ගාස්තු බිල්පත් පියවා තිබියදී අරමුදල විසින් ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විගණන ගාස්තු වශයෙන් රු.1,181,126 ක් ප්‍රතිපාදනය කර තිබුණි. නමුත් වර්ෂයකට රු. 40,000 ක් බැගින් 2011 සිට 2014 දක්වා වූ වර්ෂ හතර සඳහා කළ යුතුව තිබුණු ප්‍රතිපාදනය රු.160,000 ක් වුවද රු.1,021,126 ක් වැඩිපුර ප්‍රතිපාදනය කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් විෂයයන් සනාථ කර ගැනීම සඳහා අදාළ කර ගත හැකි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හෙතුවෙන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂයය | වටිනාකම | ඉදිරිපත් නොකල සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | ස්ථාවර වත්කම් | 17,766,770 | මෙම වත්කම් රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ භාවිතය සඳහා වර්ෂ 17 කට පෙර ලබාදී ඇති බව විගණනයට දන්වා ඇතත් එම වත්කම් ඇතුලත් ලේඛනයක් හෝ භෞතිකව පවතින බවට සාක්ෂියක් ඉදිරිපත් නොකෙරිණි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ජංගම වත්කම් | 102,158,631 | (i). විවිධ කටයුතු සඳහා ලබා දී තිබූ වර්ෂ 17කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන එකතුව රු. 15,220,514 ක් වූ අත්තිකාරම් ගිණුම් 12 ක ශේෂ සම්බන්ධයෙන් ප්‍රමාණවත් තොරතුරු හා ඒවා අයවිය යුතු පාර්ශවයන්ගේ විස්තර විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |
| | | | (ii). මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු රු.17,066,956 , රේගු දෙපාර්තමේන්තුවෙන් ලැබිය යුතු රු.286,059 ක් සහ යුධ හමුදාවෙන් ලැබිය යුතු රු. 4,260 ක් අදාල ආයතන විමසීමෙන් තොරව වර්ෂ 17 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එන අතර එම ශේෂ සත්‍ය වශයෙන්ම ලැබිය යුතුව පවතින බව තහවුරු කර ගැනීමට අදාල කිසිදු සාක්ෂියක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |
| | | | (iii). ආයෝජනය කළ මුදල් හා පොලී මුදල් සමාලෝචිත වර්ෂයේදි ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැරකර තිබුණද වර්ෂ 17 ක් තිස්සේ ගිණුම්වල දැක්වෙන රු. 102,890 ක් වූ ලැබිය යුතු ආයෝජන පොලිය නිරවුල් කර ගෙන ඇති බවට විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි. |
| | | | (iv). සමූහ සැකසුම් මධ්‍යස්ථාන සඳහා ලැබීම් සහ ව්‍යාපෘති අංක 02 යන ගිණුම් දෙකට අදාල පිළිවෙලින් රු. 3,647,219 ක් හා රු.65,477,579 ක් වූ ශේෂ පිළිබඳ ලිඛිත සාක්ෂි කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |
| | | | (v). වර්ෂ 17 ක් තිස්සේ ලැබිය යුතු මුදලක් ලෙස ඉදිරියට ගෙන එන රු. 1,800 ක තැපැල් අග්‍රිමය ලබාගත් තැනැත්තා නිශ්චිතව හඳුනා ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| | | vi වර්ෂ 17 ක් තිස්සේ ජංගම වත්කම් ලෙස ඉදිරියට ගෙන එමින් පැවති අයකර ගැනීම සම්පූර්ණයෙන්ම අවිනිශ්චිත එකතුව රු.351,353 ක් වූ ගිණුම් 05 ක ශේෂය වත්කමක් ලෙස හඳුනාගැනීමට හේතු පැහැදිලි නොවුණි. |
| ජංගම බැරකම් | 18,868,119 | (i). වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙනැවිත් තිබුණු රු.9,988,530 ක විවිධ තැන්පතුවලට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි. |
| | | (ii). ඒකාබද්ධ අරමුදලේ අත්තිකාරම් යනුවෙන් නම් කළ රු. 483 ක ප්‍රායෝගික නොවන ශේෂයක් වර්ෂ 17කට වැඩි කාලයක සිට ගිණුම්වල ඉදිරියට ගෙන ඒම සම්බන්ධයෙන් විගණනයට සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි. |
| | | (iii). ලැබිය යුතු පාර්ශව පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වර්ෂ 17 කට වැඩි කාලයක සිට පරිශේෂව පැවත එන වෛද්‍යාධාර ණය රු.57,526 ක් හා වෙනත් දෙපාර්තමේන්තු ණය රු. 416,313 ක් පොත්වලින් ඉවත්කිරීමට කටයුතු නොකිරීමට හේතු විගණනයට ඉදිරිපත් නොවුණි. |
| | | (iv). එකම කළමනාකරණයක් යටතේ පැවතියද, රබර් පාලන අරමුදලට ගෙවියයුතු රු.281,210 ක් හා රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.15,449 ක් ගෙවා නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයේදී අනාවරණය නොවුණි. |
| | | (v). ගෙවිය යුතු නිශ්චිත පාර්ශවය හා වටිනාකම හඳුනාගෙන තිබුණද, රු.22,087ක් රබර් පර්යේෂණායතනයට ගෙවා නිරවුල් කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග විගණනයට අනාවරණය නොවුණි. |

(vi). වර්ෂ 17 කට පෙර සිට කිසිදු සේවකයකු සේවයේ යොදවා නොමැති නමුත් ගෙවිය යුතු නිශ්චිත පාර්ශවයක් සඳහන් නොවන රු.90,706 ක් වූ සේවක පාරිතෝෂික බැඳීමක් ජංගම බැරකම් යටතේ දැක්වීම විගණනයේදී සෑහීමට පත්විය නොහැක.

(vii). පැල අත්තිකාරම් සහ පරිනත වගාවට පොහොර යනුවෙන් නම් කළ, පිළිවෙලින් රු. 119,550 ක් හා රු. 4,779,564 වූ ශේෂ දෙකක් වර්ෂ 17 කට වැඩි කාලයක සිට ඉදිරියට ගෙන එන අතර ඒවාට අදාල ලේඛන කිසිවක් විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

(viii). අරමුදලට අයත් නොවන ණය ලැබීම් යනුවෙන් සඳහන් රු. 3,096,701 ක් ජංගම බැරකමක් ලෙස දක්වා තිබුණද, එම අසාමාන්‍ය බැඳීම ඇතිවීමට හේතුව හෝ එම මුදල් ගෙවිය යුතු පාර්ශව කවරේද යන්න පිළිබඳ තොරතුරු හෝ විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අරමුදලට අයත් ස්ථාවර තැන්පතු සඳහා රු. 497,051 ක පොළී ආදායමක් ලබා තිබුණු අතර එය අරමුදලේ එකම ආදායම් ප්‍රභවය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු. 9,307,910 ක්වූ අදාල ස්ථාවර තැන්පතුව ආපසු ලබාගෙන ඒකාබද්ධ අරමුදලට බැර කර තිබුණු බැවින් තවදුරටත් අරමුදලේ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයක් නොපැවතුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම හා මුදල් ප්‍රවාහ ප්‍රකාශ පිළියෙල කර නොතිබුණි.

4 මෙහෙයුම් සමාලෝචනය

-------------------------

4.1 අරමුදලේ ක්‍රියාකාරකම් පිළිබඳ වර්තමාන තත්ත්වය

---------------------------------------------------

රබර් නැවත වගා සහනාධාර අරමුදල දැනට ක්‍රියාකාරීත්වයේ නොපවතින බැවින් වර්ෂයක කාලයක් තුළ අරමුදලේ ඇවර කිරීමේ කටයුතු අවසන් කිරීමට අපේක්ෂා කරන බවට රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2014 ජූලි 04 දිනැති අංක RDD/02/10/ඇවර(නැ.ව) දරන ලිපිය මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්ට දන්වා තිබුණු අතර 2014 දෙසැම්බර් 01 දින ශේෂ නිරවුල් කිරීමේ කමිටුවක් ද පත් කර තිබුණි.එම කමිටුවේ නිර්දේශ මත අරමුදලට අයත්ව තිබුණු ස්ථාවර වත්කම් හා ආයෝජන ගිණුම්වල ශේෂ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවට පැවරීම පමණක් සමාලෝචිත වර්ෂයේදී සිදු කර තිබුණු අතර ඉතිරි වත්කම් හා වගකීම් නිරවුල් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

5. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය

(ආ) ස්ථාවර වත්කම්

(ඇ) ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂ

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT


මගේ අංකය / எனது இல. / My No. LP/J/RDD/APP/2014/01

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date 2015 ජූලි 30 දින

අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2014 වර්ෂයේ විසර්ජන ගිණුම පිළිබඳව විගණකාධිපති වාර්තාව.

---

ශීර්ෂය 293 - රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව 2014 වර්ෂය සඳහා වූ 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ සඳහන් ඩීජීඑස්ඒ 1 ආකෘතියේ සිට 10 ආකෘතිය දක්වා ආකෘතිද, සටහන (i) සිට සටහන (iv) (අ) හා (ආ) දක්වා වූ තොරතුරු සාරාංශයකින් සමන්විත 2014 වර්ෂය සඳහා වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, 2013 අංක 36 දරන විසර්ජන පනත හා වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, 2014 වාර්ෂික අයවැය ඇස්තමේන්තුවට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ විධිවිධාන ඇතුළත් රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කරන ලද විසර්ජන ගිණුම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2014 දෙසැම්බර් 01 දිනැති අංක 239/2014 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු විසර්ජන ගිණුම සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 2. විගණන විෂය පථය

විසර්ජන ගිණුමේ දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන 2013 අංක 36 දරන විසර්ජන පනතින් පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද වියදම් සීමාවන් තුළ උපයෝජනයන් සිදු කලේද යන්න හා විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් විසර්ජන ගිණුමේ ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චයමත


අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම විසර්ජන ගිණුමේ සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

## 3. විසර්ජන ගිණුම සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 52 ව්‍යවස්ථාව සමඟ කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 හා 127 හි දක්වා ඇති කාර්යභාරයන් සම්බන්ධයෙන් වූ රාජ්‍ය මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු කිරිම සඳහා ප්‍රධාන ගණන්දීමේ නිලධාරින් මුදල් අමාත්‍යවරයාට වගකිව යුතු අතර අමාත්‍යාංශයේ හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තුවල මුදල් කටයුතු අධීක්ෂණය කිරීමේ වගකීම භාණ්ඩාගාරයේ විධානයන්ට යටත්ව ගණන්දීමේ නිලධාරින්ට හා ගණන්දීමේ නිලධාරින්ට පැවැරේ. ඒ අනුව විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්ට, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්ට, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙනයාම, පිළියෙල කිරිම හා ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ විසර්ජන ගිණුම පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය සැලැසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම හා පවත්වා ගෙන යාම මෙම වගකිමට ඇතුළත් වේ.

## 4. විගණන නිරීක්ෂණ

2014 වර්ෂය සඳහා ශීර්ෂ 293 දරණ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම පහත දැක්වෙන 4.1 ඡේදයේ සිට 4.5 ඡේදය දක්වා වූ කරුණු දැක්වීම්වලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

4.1 ඇස්තමේන්තු ප්‍රතිපාදන සදොස් ලෙස දැක්වීම

---

පෞද්ගලික පඩිනඩි සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු. 178,700,000 ක් වුවද, එය රු.180,200,000 ක් ලෙසද, අනෙකුත් වියදම් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදනය රු.50,600,000ක් වුවද, එය රු. 49,100,000 ක් ලෙසද, විසර්ජන ගිණුමේ දක්වා තිබුණි.

4.2 ප්‍රාග්ධන ප්‍රතිපාදන ඉතිරිවීම්

---

ප්‍රාග්ධන වැය විෂයන් 05 කට අදාලව ප්‍රතිපාදනය කර තිබූ මුදලින් සියයට 20 – 46 ත් අතර පරාසයක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. ප්‍රාග්ධන වැඩ නිසි පරිදි සම්පූර්ණ කිරීමට නොහැකි වීම නිසා මෙසේ ඉතිරිව තිබුණි. විස්තර පහත දැක්වේ.

4.3 මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රාග්ධන වැය විෂයන් 02 ක මුල් ඇස්තමේන්තුවෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සියයට 52 – 90 ත් අතර ප්‍රමාණයක් මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණි.

(ආ) D.G.S.A.- 03 ආකෘතියේ මුදල් රෙගුලාසි 66 හා 69 මාරු කිරීම් තීරුවේ රු. 2,100,000 ක් දක්වා තිබුණද තථ්‍ය වශයෙන් මාරුකර තිබුණු වටිනාකම රු. 600,000 කි.

4.4 මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කිරීමෙන් අනතුරුව එම වැය විෂයන්හි ප්‍රතිපාදන ඉතිරි වීම්

---

එක් එක් වැය විෂයට අදාල වියදම නිසි පරිදි පුරෝකථනය කිරීමකින් තොරව මුදල් රෙගුලාසි 66 මඟින් වෙනත් වැය විෂයන්ගෙන් රු. 850,000 ක ප්‍රතිපාදන වැය විෂයයන් 02 කට මාරු කර ගෙන තිබුණු අතර එම වැය විෂයන්හි රු. 356,888 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

4.5 බැරකම් හෙළිදරව් කිරීම

------------------------------

පහත සඳහන් වැය විෂයන්ට අදාලව ගෙවීම් වවුචර් අනුව බැරකම් හා විසර්ජන ගිණුමේ දක්වා තිබූ බැරකම් අතර වෙනස්කම් නිරීක්ෂණය විය.

| වැය විෂයය | ගෙවීම් වවුචර් අනුව නිවැරදි බැරකම | විසර්ජන ගිණුමේ දක්වා ඇති බැරකම | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| 293-2-1-1401 | - | 10,000 | 10,000 |
| 293-2-1-1402 | 484,813 | 303,853 | 180,960 |

5. පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

-----------------------------------

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාර මා විසින් ශීර්ෂ 293 ට අදාලව මූල්‍ය හා කාර්යසාධනය පිළිබඳ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඊ.ඒ.ජී.ආනන්ද

සහකාර විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත :- 1. ලේකම්, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

2. අධ්‍යක්ෂ ජනරාල්, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව